# ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

# වාර්ෂික වාර්තාව 2011

# ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

- අධ්‍යක්ෂක මණ්ඩල වාර්තාව
- මූල්‍ය ප්‍රකාශණ
- 2011 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සදහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව

ප්‍රධාන කාර්යාලය
නො.11, ආදිපාද වීදිය
කොළඹ 01.

# අධ්‍යක්ෂ මණ්ඩලය - 2011

| නම | තනතුර |
|---|---|
| ^ ප්‍රියංකා ද අල්විස් මහතා | සභාපති |
| ^ කේ. කේ. එස්. පෙරේරා මහතා | විධායක අධ්‍යක්ෂ |
| ^ එම්. එස්. එම්. ප්‍රනාන්දු මහතා | ක්‍රියාකාරී අධ්‍යක්ෂ |
| ^ කේ. පී. ජී. අයි. එන්. බණ්ඩාර මහතා | සාමාජික |
| ^ ඒ. ආර්. වික්‍රමසිංහ මිය | සාමාජික/භාණ්ඩාගාරයේ නියෝජිත |
| ^ එස්. අබේවික්‍රම මහතා | සාමාජික |
| ^ ඩබ්ලිව්. ජෝර්ජ් ලාන්සා මහතා | සාමාජික |
| ^ බ්‍රයන් එවන්ස් කුංගේ මහතා | සාමාජික(2011ජූලි සිට) |
| ^ මාලින්ද ගුණතිලක මයා | සාමාජික (2011ජූලි සිට) |
| ^ ආර්.ඒ. ඩී. එම්. රූපසිංහ මයා | සාමාජික (2011ජූලි සිට) |
| ^ ආර්. ආර්. ලියන්වල මයා | සාමාජික(2011ජුනි දක්වා) |
| ^ බී. කේ. උළුවිසිහේවා මයා | සාමාජික(2011ජුනි දක්වා) |

# කළමනාකරණ කණ්ඩායම 2011

| නම | තනතුර |
|---|---|
| ප්‍රියංක ද අල්විස් මහතා | සභාපති / ප්‍ර.වි.නි. |
| ආර්. සෝමරත්න මහතා | සාමාන්‍යාධිකාරී |
| ආර්. එම්. අබේසිංහ මහතා | මූල්‍ය කළමනාකාර |
| එස්. ඩී. නයනා රණසිංහ මිය | ගණකාධිකාරිණී |
| බී. වී. එල්. සී. බෙනරගම මිය | සහකාර කළමනාකාරිණී(පාලන) |
| වී. කදිරගාමර් මයා | සහකාර කළමණාකරු (වැව්ලි) |
| ජේ. පී. දහනායක මයා | විගණන නිලධාරී |
| එම්.ටී.ටී මොරහැල මිය | සහකාර ගණකාධිකාරිණී |
| ජී. ඩී. එස්. සී. සුදසිංහ මෙනවිය | සහකාර කළමනාකාරිණී(ඉඩම්) |
| ලලනී ගමරාලලාගේ මිය | කණිෂ්ඨ විධායක |
| ඒ.කේ.එම් ජයතිලක මයා | කණිෂ්ඨ විධායක |
| ඩී.ඒ.එච්. ඇන් ගුණවර්ධන මිය | ලේකම් |

# වතු විධායක නිලධාරීන්

| | | |
|---|---|---|
| ^ | උපාලි අබේකෝන් මහතා | කළමනාකාර - වැව්ලි |
| ^ | ටී.ඒ.එම්.පී.අයි.කේ. තෙන්නකෝන් මහතා | වතු අධිකාරි - අලකොල්ල |
| ^ | ඒ. සී. අබේවර්ණ මහතා | වතු අධිකාරි - කොටගග |
| ^ | එස්. බී. හේරත් මහතා | වතු අධිකාරි - ගල්පිහිල්ල |
| ^ | අයි. ඩබ්. ආර්. ජයවර්ධන මහතා | වතු අධිකාරි - ගෝමර |
| ^ | ටී. ආර්. එච්. හේවගේ මහතා | වතු අධිකාරි - හාගල |
| ^ | කේ. ජී. ගුණරත්න මහතා | වතු අධිකාරි - හෙයාර්පාක් |
| ^ | ආර්. ඒ. එම්. දයාරත්න මහතා | වතු අධිකාරි - හුන්නස්ගිරිය |
| ^ | එච්. එන්. පී. ජිනසේන මහතා | වතු අධිකාරි - කැලැබොක්ක |
| ^ | වයි. ඒ. ටී. බී. වඩුගොඩපිටිය මහතා | වතු අධිකාරි - මිඩ්ලන්ඩ්ස් |
| ^ | ඩබ්.ටී.කේ. සමරතුංග මහතා | වැ.බ.වතු අධිකාරි, ඕපල්ගල |
| ^ | ආර්.ඒ.ආර්.එම්.රණවක මහතා | වතු අධිකාරි - රංගල |
| ^ | ඒ. ඒ. සේනාරත්න මහතා | වතු අධිකාරි - වලහන්දූව |
| ^ | එස්. වයි. ලියනගේ මහතා | වතු අධිකාරි - ප්‍රා.කාර්යාලය |

# අපගේ දැක්ම

හොඳම තිරසාර වැවිලි ආයතනය
බවට පත්වීම

# අපගේ මෙහෙවර

තිරසාර සම්පත් උපයෝජනය තුළින් සේවක ජීවන තත්ත්වය ඉහළ නංවන අතර හොඳම තේ කෝප්පයක් සහ කෘෂි නිමැවුම් නිපදවමින් හා වෙනත් සේවා සපයමින් ලාභදායී රාජ්‍ය වැවිලි ආයතනය බවට පත්වීම

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව - 2011

## 1. හැඳින්වීම

රජය සතු වතු කළමනාකරණය කිරීම සඳහා 1958 අංක 04 දරන පනත මගින් සංස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, වතු කිහිපයක කළමනාකරණය පවරා ගනිමින් ස්ථාපිත වන්නට විය. 1972 ඉඩම් ප්‍රතිසංස්කරණ පනත ක්‍රියාත්මක වීමත් සමග සියළුම ලාභ ලබන වතු රජයට පවරා ගෙන ඒවා වඩා ඵලදායී ලෙස කළමනාකරණය කිරීම පිණිස 1975 වසරේදී සංශෝධනය කරන ලද පනත මගින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව හා ජනතා වතු සංවර්ධන මණ්ඩලය (ජනවසම) වෙත පවරා දෙන ලදී.

1992 වසරේ රාජ්‍ය සංස්ථා හා දේපළ පෞද්ගලික සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ දෙවන වගන්තිය යටතේ, රාජ්‍ය වැවිලි සංස්ථාව හා ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් කළමනාකරණය කරන ලද වතු 450 ක් ප්‍රාදේශීය සමාගම් වෙත කල්බදු ක්‍රමය යටතේ පවරා දෙන ලද අතර, ඉතා ඉහළ පාඩු මත හා අඩු කෘෂිකාර්මික ඵලදායිතාවයක් සහිත මධ්‍ය කඳුකර වතු 55 ක් පමණක් එසේ නොකොට රඳවා තබා ගන්නා ලදී. එම වතු 55 න් 32 ක් ශ්‍රී. ලං. රා. වැ. ස. වෙත පවරා දී එයිනුත් නැවත සීමා මායිම් සලකුණු කරනු ලැබූ වතු 11 ක් ඇල්කඩුව වතු සමාගම වෙත භාර දුන් අතර ශ්‍රී. ලං. රා. වැ. ස. කළමනාකරණය යටතට පත්වූයේ වතු 16 ක් පමණි. 1992 වසරේදී කාර්ය මණ්ඩලය විශ්‍රාම ගන්වා ශ්‍රී.ලං.රා.වැ.ස. වසා දමන ලද අතර 1994 වසරේදී නව කාර්ය මණ්ඩලය බඳවා ගනිමින් නැවතත් මෙහෙයුම් ආරම්භ කරන ලදී.

අද වන විට ශ්‍රී. ලං. රා. වැ ස. රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ විෂයපථය යටතේ ගැනෙන අතර, අතීතයේදී එය සතුව තිබූ වතු පෞද්ගලික පාර්ශ්වයන් වෙත භාර දීමෙන් / වෙනත් වතු සමඟ ඒකාබද්ධ කිරීමෙන් අනතුරුව මේ වන විට එය සතුව ඇත්තේ වතු 12 ක් පමණි. 2010 වසරේදී නිකොලඔය වත්ත මිඩ්ලන්ඩ්ස් වත්ත සමග ඒකාබද්ධ කරන ලද අතර ශ්‍රී. ලං. රා. වැ. ස. විසින් කළමනාකරණය කරනු ලබන වතු සංඛ්‍යාව 12 කි. ඒවා පහත සඳහන් දිස්ත්‍රික්ක යටතට ගැනේ.

| | |
|---|---|
| මාතලේ දිස්ත්‍රික්කය | මිඩ්ලන්ඩ්ස් සහ ඔපල්ගල රාජ්‍ය වතුයායන් |
| මහනුවර දිස්ත්‍රික්කය | අලකොල්ල, කොටගහ, ගල්පිහිල්ල, හෙයාපාක්, හුන්නස්ගිරිය, කැලැබොක්ක, ගෝමර භාගල්ල , රංගල රාජ්‍ය වතුයායන් |
| ගාල්ල දිස්ත්‍රික්කය | වලහන්දූව රාජ්‍ය වතුයාය |

ඉහත සඳහන් වතු 12න් 11 ක් මධ්‍ය කඳුකර තේ නිෂ්පාදන වතුයායන් වන අතර වලහන්දූව වතුයාය නිෂ්පාදනය කරනුයේ රබර් ය.

සමාලෝචිත වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 08 ක් පැවැත්විණි.

## 2. වතු වල වත්මන් තත්ත්වය

ශ්‍රී.ලං.රා.වැ.ස. විසින් කළමනාකරණය කරනු ලබන වතු වල භූමි ප්‍රමාණයන් දක්වෙන හෙක්ටයාර ප්‍රකාශය පහත දක්වේ.

| **විස්තරය** | **හෙක්ටයාර් ප්‍රමාණය** |
|---|---|
| වගා කරන ලද ඉඩම් | 6,114.05 |
| ගොඩනැගිලි | 480.56 |
| දැව / වන රක්ෂිත | 2,708.43 |
| මංමාවත් | 187.38 |
| වෙනත් හිස් ඉඩම් | 192.82 |
| මුළු ඉඩම් ප්‍රමාණය | **9,683.24** |

ශ්‍රී.ලං.රා.වැ.ස. අයත් අලකොල්ල, ගල්පිහිල්ල, කැලැබොක්ක, මිඩ්ලන්ඩ්ස් සහ රංගල යන තේ කර්මාන්තශාලාවල සී. ටී. සී. නිෂ්පාදන සිදු කෙරෙන අතර ගෝමර පිහිටි කර්මාන්තශාලාවේ නිෂ්පාදනය සාම්ප්‍රදායික ක්‍රමය අනුව සිදු කෙරේ.

### 3. දැව හා වන රක්ෂිත

අස්වනු නෙලා ගත හැකි තත්ත්වයේ පවතින දැව හා වන රක්ෂිත ඉඩම් විශාල ප්‍රමාණයක් ශ්‍රී. ලං රා. වැ. ස. සතු වතුවල පවතින අතර ඒවායේ වටිනාකම රුපියල් මිලියන 3000කට ආසන්නය. එම ඉඩම් ප්‍රමාණයන් පහත සටහනේ දක්වේ.

| **වතු යාය** | **ඉඩම් ප්‍රමාණය** | **කපාගත හැකි ගස් සංඛ්‍යාව** |
|---|---|---|
| අලකොල්ල | 79.38 | 500 |
| කොටගග | 24.14 | 350 |
| ගල්පිහිල්ල | 20.21 | 16,720 |
| ගෝමර | 71.50 | 7,100 |
| හාගල | 84.62 | 11,700 |
| හෙයාපාක් | - | 1,800 |
| හුන්නස්ගිරිය | 25.00 | 18,247 |
| කැලැබොක්ක | 15.00 | 30,824 |
| රන්ගල්ල | 68.00 | 10,000 |
| මිඩ්ලන්ඩ්ස් | 227.14 | 14,000 |
| ඔපල්ගල | 68.00 | 16,868 |
| වුඩ්සයිඩ් | 6.50 | 6,800 |
| එකතුව | 689.52 | 134,909 |

ක්‍රමෝපායික ලෙස ගස් කපාගැනීමට හා අදියර ක්‍රමයට නැවත වන වගා කිරීමට අවශ්‍ය වැඩසටහන් මේ වන විට ක්‍රියාත්මක වේ.

## 4. කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ මුළු නිමි තේ එලදාව කි. ග්‍රෑ. 2,166,037 වූ අතර එය 2010 වසරට සාපේක්ෂව 1% ක පහළ යාමකි. වසර අවසන් වන විට හෙක්ටයාරයක සාමාන්‍ය එලදාව වන කිලෝග්‍රෑම් 674 ක ප්‍රමාණය පවත්වා ගැනීමට හැකි වූ අතර ඉහළම එලදාව වන හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 1094 ගල්පිහිල්ල වතුයායෙන් වාර්තා විය. එය සාමාන්‍ය අපේක්ෂිත එලදාවට වඩා කි. ග්‍රෑ. 420 ක වර්ධනයක් වූ අතර එම වතුයායේම පසුගිය වසරේ එලදාවට වඩා කි. ග්‍රෑ. 185 ක ඉහළ යාමකි.

## 5. භාණ්ඩාගාර ප්‍රදානයන්

මෙම වසර තුළ භාණ්ඩාගාර ප්‍රදානයන් නොලැබුණු අතර 50% ක අධිභාරයද ඇතුළුව එවන් පාරිතෝෂිත මුදල් ගෙවීම සඳහා සංස්ථාව සතු මුදල් යොදවන ලදී.

## 6. ලාභදායිත්වය

| විස්තරය | | 2011 | 2010 | විචල්‍යය | % |
|---|---|---|---|---|---|
| මුළු නිෂ්පාදනය-තේ.කි.ග්‍රෑම් | | 2,166,037 | 2,188,835 | 22.79 | 1 |
| වාර්ෂික සාමාන්‍යය | රු. | 243.77 | 247.80 | 4.04 | 1.6 |
| නිෂ්පාදන පිරිවැය සාමාන්‍යය | රු. | 330.46 | 291.11 | 39.35 | 13.5 |
| කි. ග්‍රෑ. 1 කට අලාභය | රු. | 86.69 | 43.31 | 33.38 | 100 |
| වසර තුළ වාර්තාගත මුළු අලාභය | රු | 187,773,700 | 94,798,000 | 92,975,700 | 98 |

## 7. සංසන්දනාත්මක නිෂ්පාදන ආදායම

පසුගිය වසර 5 සඳහා සංසන්දනාත්මක තොරතුරු

| වර්ෂය | නිෂ්පාදන කරන ලද මුළු තේ කි.ග්‍රෑ.ප්‍රමාණය | විකුණුම් මිල | නිෂ්පාදන පිරිවැය සාමාන්‍යය | කි.ග්‍රෑමයකට සාමාන්‍යය | මුළු ලාභය/ අලාභය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු | රු. |
| 2011 | 2,166,037 | 243.77 | 330.46 | (86.69) | (187,773,700) |
| 2010 | 2,188,835 | 247.80 | 291.11 | (43.31) | (94,798,000) |
| 2009 | 2,069,706 | 248.98 | 283.05 | (34.07) | (70,514,900) |
| 2008 | 2,721,633 | 206.00 | 218.68 | (12.68) | (34,510,300) |
| 2007 | 2,460,086 | 225.97 | 220.46 | 5.51 | 13,555,000 |

## 8. වගා කිරීම, නඩත්තුව හා පොහොර යෙදීම

සමාලෝචිත වසර තුළ ක්ෂේත්‍ර සංවර්ධනය හා වගා කිරීමේ වියදම් රු.මිලියන 64.9 ක් වැය කරන ලද අතර සංස්ථාව මුහුණ දී ඇති බරපතල මූල්‍ය තත්ත්වය මත වුවද ඉන් රු. මිලියන 25.2 ක් පොහොර සඳහා වැය කරන ලදී.

## 9. කාර්ය සාධනය

නිෂ්පාදන පිරිවැය අවම කිරීමටත් නිෂ්පාදන සඳහා ඉහළ මිලක් ලබාගැනීමටත් අවශ්‍ය සියළු පියවර ගෙන තිබුණද තේ දළු වල තත්ත්වය අපේක්ෂිත ගුණාත්මක මට්ටමින් නොතිබීමත් අපගේ කර්මාන්තශාලාවල ඇති යල්පැන ගිය යන්ත්‍රෝපකරණ හා ඉහළ ගුණාත්මක භාවයකින් යුත් තේ නිෂ්පාදනය කිරීම සඳහා කර්මාන්තශාලා නවීකරණය කිරීමට අවශ්‍ය මුදල් ප්‍රමාණවත් නොවීමත් හේතුවෙන් එම ඉලක්කය සපුරා ගැනීමට නොහැකි විය.

## 10. ප්‍රාග්ධන වියදම්

බරපතල මූල්‍ය දුෂ්කරතා මත වුවද, පහත සඳහන් වැඩ කටයුතු සිදු කිරීමට ශ්‍රී.ලං.රා.වැ.ස. . සමත් විය. නව වැඩකටයුතු කිසිවක් ආරම්භ නොකරන ලදී.

| | | |
|---|---|---|
| නොමේරූ වගාවන් | රු. 6,493,877/- | ක්‍රියාත්මක වැඩ අගය |
| ගොඩනැගිලි | රු. 111,765/- | වැඩි දියුණු කිරීමේ අගය |
| යන්ත්‍රෝපකරණ | රු. 623,417/- | ප්‍රධාන අළුත්වැඩියාවන් |
| උපකරණ | රු. 46,729/- | නව මිලදී ගැනීම් |
| වාහන | රු. 1,048,994/- | ප්‍රධාන අළුත්වැඩියාවන් |

## 11. කාර්ය මණ්ඩලය සහ ශ්‍රම බලකාය

අතිරික්ත කාර්ය මණ්ඩලය හඳුනාගෙන ස්වේච්ඡා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ගිවිසගෙන තිබුනද වසර තුළ මුහුණ දී තිබුණු ද්‍රවශීලතා අර්බුදය හේතුවෙන් සේවකයින් විශ්‍රාම යැවීම කළ නොහැකි විය.

වතු වල සේවයේ යෙදී සිටින සේවකයන් අතුරින් සේවකයන් 600 ක් පමණ වයස අවුරුදු 60 ඉක්මවූවන් හේතුවෙන් ඒවායේ ඵලදායිතාවය පහළ බැස තිබුණි. උපරිම ඵලදායිතාවය ලබා ගැනීමට හා නිෂ්පාදන පිරිවැය පහළ දැමීම සඳහා එවන් සේවකයන් හට පාරිතෝෂිත මුදල් ගෙවා විශ්‍රාම ගන්වා තරුණ කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට ප්‍රතිපත්තිමය වශයෙන් එකඟ වී තිබේ.

කාර්යාලයේ / ක්ෂේත්‍රයේ / කර්මාන්ත ශාලාවේ සේවයේ යෙදී සිටින වයස අවුරුදු 60 ඉක්මවූ කාර්ය මණ්ඩලය වෙනුවට වතු ක්ෂේත්‍රය තුළින් සුදුසුකම් ලත් තරුණ පුද්ගලයින් හඳුනාගෙන අත්දැකීම් ලත් පුද්ගලයින් මගින් ඔවුන්ට අදාල පුහුණුව ලබා දීමට අවශ්‍ය ක්‍රමවේදය මේ වන විට ක්‍රියාත්මක කොට තිබේ.

## 12. මූල්‍ය තත්ත්වය

**කාරක ප්‍රාග්ධනය**

| **වර්ෂය** | **2011** | **2010** |
|---|---|---|
| දැනට ඇති වත්කම් | 280,869,504 | 321,860,485 |
| දැනට ඇති වගකීම් | 966,218,163 | 867,805,431 |
| ප්‍රාග්ධනය | (685,348,659) | (545,944,946) |

ගත වූ වසර තුළ කාරක ප්‍රාග්ධන හිඟය ඉහළ ගිය අතර දෛනික සේවක ගෙවීම්, කාර්ය මණ්ඩල වැටුප් හා ව්‍යවස්ථාපිත ගෙවීම් ඉහළ යාම ඊට හේතු විය.

**මුදල් ප්‍රවාහය**

සංස්ථාවේ හා කර්මාන්තයේ මූල්‍ය අර්බුදය හේතුවෙන් ඉහළ ගිය හිඟයේ ප්‍රතිඵලයක් ලෙස පසුගිය වසරට (2010) සාපේක්ෂව 2011 වසරේදී බැංකු අයිරා ඉහළ ගොස් ඇත.

## 13. ඉදිරි ගමන් මග

කාර්යක්ෂමතාවය ඉහළ මට්ටමකට ගෙන ඒමටත් වතු යාය වලින් ඉහළ ඵලදායිතාවයක් අත්පත් කර ගැනීමටත් අවශ්‍ය ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක් හඳුනාගෙන මේ වන විට ඒවා අධ්‍යයනය කරමින් පවතී. ඒවා නම්:

- තේ නැවත වගා කිරීම
- අඩුපාඩු සහිත තැන්වල තේ පැල සිටුවීම
- සංස්ථාවේ මුදල් ප්‍රවාහය වර්ධනය කිරීම සඳහා වූ දැව සම්පත් කළමනාකරණ වැඩසටහන
- දැනට ඇති තේ තවාන් සංවර්ධනය
- කුඩා ජල ව්‍යාපෘති ස්ථාපිත කිරීම
- පරිසර සංචාරක සංකල්පය හඳුන්වා දීම
- HACCP හා ISO සහතික ලබා ගැනීම සඳහා කර්මාන්තශාලා නවීකරණය කිරීම
- පැරණි වාහන ධාවනයෙන් ඉවත් කිරීම හා ඒ වෙනුවට වතුවල ධාවනයට සුදුසු වාහන මිලදී ගැනීම ආදේශ කිරීම
- සංවිධානය තුළට නව තාක්ෂණය හඳුන්වා දීම
- උපරිම ඵලදායිතාවය ලබා ගැනීම සඳහා මානව සම්පත් කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම

## 14. සභාපතිවරයාගේ / ප්‍ර. ග. නි. ගේ පණිවිඩය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව මුහුණපා සිටින බරපතල මූල්‍ය දුෂ්කරතාවය මත වුවද ප්‍රධාන කාර්යාලයේ සහ වතුයාය වල කාර්ය මණ්ඩල සේවකයින් සහ අනෙකුත් සියලු පාර්ශ්වයන්ගෙන් ලද මනා සහයෝගය හේතුවෙන් මෙන්ම රාජ්‍ය ව්‍යවසාය කළමනාකරණ හා සංවර්ධන අමාත්‍යාංශයෙන් ලද ඉමහත් සහයෝගය හේතුවෙන් සභාපතිවරයා ලෙස මාගේ කාර්යයන් ඉතා පහසුවෙන් හා මැනවින් ඉටු කිරීමට මට හැකියාව ලැබුණු බව කෘතවේදීව **සඳහන් කලයුතුය.**

සභාපති / ප්‍ර. ග. නි.
ශ්‍රී. ලං. රා. වැ. ස.

# ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

**(ප්‍රධාන කාර්යාලය සහ වතු ඒකාබද්ධ )**
**2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය**

| **වත්කම්** | සටහන | **පිටු අංකය** | **2011 රු.** | **2010 රු.** |
|---|---|---|---|---|
| ජංගම නොවන වත්කම් | | | | |
| දේපල පිරියත හා උපකරණ | 1 | 16/17 | 644,120,161 | 503,844,634 |
| විලම්භිත වත්කම් | 2 | 18 | 42,162,674 | 32,671,001 |
| ප්‍රාග්ධන කෙරීගෙන යන වැඩ | 3 | 18 | 1,806,644 | 1,131.378 |
| මුළු ජංගම නොවන වත්කම් | | | **688.089.479** | **537,647,013** |
| ආයෝජන - බි.සී.සී. සමාගම | | | 15,404,568 | 15,404,568 |
| ජංගම වත්කම් | | | | |
| ස්ථාවර තැන්පතු | | | 57,482,590 | 10,000,000 |
| නිමි භාණ්ඩ අවසන් තොගය | 4 | 18 | 66,718,545 | 72,952,206 |
| තොග - යෙදවුම් හා පාරිභෝගික ද්‍රව්‍ය | 5 | 19 | 10,287,338 | 7,787,888 |
| තැන්පතු | 6 | 19 | 68,780,625 | 93,847,267 |
| වෙළඳ ණය ගැතියෝ | 7 | 19 | 120,552,495 | 127,114,692 |
| ලැබිය යුතු මුදල් | 8 | 20 | 32,729,199 | 45,768,070 |
| මුදල් හා මුදල් හා සමාන දේ | 9 | 20 | (91,085,856) | (51,039.002) |
| මුළු ජංගම වත්කම් | | | **265,464,936** | **306,431,122** |
| මුළු වත්කම් | | | **968,958,982** | **859,482.703** |
| **ස්කන්ධය හා වගකීම්** | | | | |
| **මූල්‍යයනය වූයේ** | | | | |
| 1958 අංක දරණ පනතේ 7(1) වන වගන්තියෙන් සහතික කළ | | | 8,000,000 | 8,000,000 |
| 1958 අංක දරණ පනතේ 7(1) වන වගන්තියෙන් සහතික කළ 1981 අගෝස්තු 8වන දින සම්මත කරන ලද අමාත්‍ය මණ්ඩල යෝජනාව | | | 3,889,000,000 | 3,889,000,000 |
| | | | **3,897,000,000** | **3.897,000,000** |
| ප්‍රාග්ධන සංචිත | | | 142,051,688 | 142,051.688 |
| රජයේ දායකත්වය | | | 395,987,977 | 395,987,977 |
| ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් | 10 | 21 | (880,292,080) | (864,450,572) |
| | | | **(342,252,416)** | **(326,410,907)** |
| ජංගම නොවන වගකීම් | | | | |
| රක්ෂණ භාර මුදල් | | | 18,145,415 | 18,145,415 |
| ගෙවියයුතු පාරිතෝෂික මුදල් | 11 | 21 | 324,914,776 | 194.762,672 |
| අක්‍රිය ගිණුම් ශේෂය | | | 1,933,044 | 105,180,092 |
| | | | 344,993,235 | 318,088,180 |
| ජංගම වගකීම් | | | | |
| ණයකරුවන් හා වගකීම් | 12 | 22 | **966,218,163** | **867,805,430** |
| | | | **968,958,982** | **859,482,703** |

මුල්‍ය වාර්තාව සකස් කිරිමේ දී ශ්‍රී ලංකා විගණන හා ගිණුම් ප්‍රමිතීන් පිළිබඳ උපදේශණ මණ්ඩලය විසින් පුසිද්ධ කරන ලද ගිණුම් පුමිතින්ට අදාල වන පරිදි සකස් කර ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

| | |
|---|---|
| **ප්‍රියංකා ද අල්විස්** | **ආර්.එම්.අබේසිංහ** |
| ස**භාපති** | **මුල්‍ය කළමණාකරු** |
| **ශ්‍රී.ලං.රා.වැ.ස.** | **ශ්‍රී.ලං.රා.වැ.ස.** |

# ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

ප්‍රධාන කාර්යාලය සහ වතු සඳහා ඒකාබද්ධ කළ

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

| | සටහන | පිටු අංකය | 2011 රු. | 2010 රු. |
|---|---|---|---|---|
| **විකුණුම් ආදායම** - නිම් තේ | 13 | 23 | 493,125,426 | 501,491,402 |
| - සුළු බෝග | 14 | 23 | 4,123,220 | 3,941,565 |
| - අමු තේ දළු | | | 54,558,617 | 69,644,440 |
| මුළු ආදායම | | | 551,807,263 | 575,077,407 |
| අඩු කළා - නිෂ්පාදන පිරිවැය | | | (703,258,306) | (648,677,914) |
| | | | (151,451,043) | (73,600,507) |
| **එකතු කළා - වෙනත් ආදායම්** | | | | |
| වෙනත් ආදායම් - වතු හා ප්‍රධාන කාර්යාලය | 15 | 23 | 217,991,734 | 156,061,689 |
| ඉතිරිකිරීමේ ගිණුම් පොලිය | | | | 1,577,450 |
| මුළු ආදායම (පාඩුව) | | | **66,540,690** | **84,038,632** |
| **අඩු කළා** -මානව සම්පත් පිරිවැය | 16 | 24 | 26,787,175 | 22,959,294 |
| වතු පරිපාලනය සඳහා වියදම් | 17 | 24/25 | 61,294,550 | 47,931,000 |
| මූල්‍ය වියදම් | 18 | 25 | 30,872,441 | 27,323,019 |
| **ආදායම් බදු ගෙවීමට පෙර ලාභය / අලාභය** | | | **(52,413,476)** | **(14,174,680)** |

**2011.දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහය**

| | | | |
|---|---|---|---|
| **ආදායම් බදු වලට පෙර ශුද්ධ ලාභය / අලාභය** | | | **(52,413,476)** |
| **<u>ගැලපීම්</u>** | | | |
| **එකතකලා - ක්ෂයවීම්** | ප්‍ර/කා | | 1,105,000 |
| | වතු | | <u>18,617,504</u> |
| **මෙහෙයුම් වලින් ලද ලාභය** | | | **(32,690,972)** |
| අඩු කලා : මෙහෙයුම් නොවන වෙනත් ආදායම් - වලහන්දූව | | | 15,576,630 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය/ (අලාභය)** | | | **(48,267,602)** |
| එකතුකලා - පාරිතෝෂිත වෙන්කිරිම්/ - පු.කා. | | | 2,686,334 |
| | වතු | | 18,105,993 |
| | | | **(27,475,275)** |
| **<u>කාරක ප්‍රාග්ධනය වෙනස්කම්</u>** | | | |
| (වැඩිවීම) අඩුවීම | තේ තොග | | 6,233,661 |
| (වැඩිවීම) අඩුවීම | යෙදවුම් හා පාරිභෝගික ද්‍රව්‍ය | | (2,499,450) |
| (වැඩිවීම) අඩුවීම | වෙළඳ ණයගැතියෝ හා ලැබියුතු මුදල් | | 44,667,711 |
| වැඩිවීම (අඩුවීම) | ගෙවියයුතු පාරිතෝෂිත | | (91,102,642) |
| වැඩිවීම (අඩුවීම) | වෙළඳ ණය හිමියෝ හා වෙනත් ගෙවිය යුතු මුදල් | | 98,412,732 |
| **කාරක ප්‍රාග්ධනයට පසු මෙහෙයුම් ලාභය** | | | **28,236,737** |
| ආයෝජන කියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය | | | |
| ස්ථාවර තැන්පතු | | | 47,482,590 |
| උපකරණ හා ලිබඩු සවිකිරීම් | | | 1,236,519 |
| ගොඩනැගිලි | | | 111,765 |
| යන්ත්‍රෝපකරණ | | | 623,417 |
| විලම්භිත වත්කම් | | | 9,491,673 |
| මෝටර් වාහන | | | 2,008,923 |
| වගාව | | | 6,493,876 |
| වන කළමනාකරණය | | | 161,000 |
| දැනට ක්‍රියාත්මක ප්‍රාග්ධන වැඩ | | | <u>673,828</u> |
| | | | **68,283,592** |
| | **ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(40,046,854)** |
| වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ | | (51,039,002) | |
| වසර අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ | | (<u>91,085,856</u>) | **<u>(40,046,854)</u>** |

# ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

1 වන සටහන

2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සඳහා සටහන්

දේපළ පිරියත හා උපකරණ - වතු හා ප්‍රධාන කාර්යාලය රු.

| ප්‍රධාන කාර්යාලය | 2011.01.01 දිනට පිරිවැය | වර්ෂය තුලදී මිලදී ගැනීම් | බැහැර කිරීම | 2011.12.31 දිනට පිරිවැය/ ක්ෂයවිම් නැත. | 2011.01.01 දිනට සමුච්ඡිත ක්ෂයවීම | වර්ෂය තුළ ක්ෂයවීම | වර්ෂය තුළ ඉවත් කළ ණය | 2011.12.31 දිනට සමුච්ඡිත ක්ෂයවීම | 2011.12.31 දිනට ශුද්ධ පොතේ අගය |
|---|---|---|---|---|---|---|---|---|---|
| ගොඩනැගිලි | 4,959,427 | | | 4,959,427 | 4,959,384 | | | 4,959,384 | 43 |
| උපකරණ | 9,996,252 | 1,133,690 | - | 11,129,942 | 8,827,922 | 287,750 | | 9,115,672 | 2,014,270 |
| ලිබඩු සහ සවිකිරීම් | 1,800,492 | 6,100 | - | 1,806,592 | 1,458,359 | 4,350 | | 1,462,709 | 343,883 |
| භූමියේ සිදුකළ වැඩිදියුණු කිරීම් | 2,386,505 | 147,613,495 | - | 150,000,000 | | | | | 150,000,000 |
| වාහන | 65,155,473 | 959,928 | - | 66,115,401 | 62,755,413 | 796,240 | | 63,551,653 | 2,563,748 |
| **වන වගා සංවර්ධනය** | 1,484,340 | 161,000 | | 1,645,340 | | | | | 1,645,340 |
| පරිගණක | | 50,000 | | 50,000 | | 16,660 | | 16,660 | 33,340 |
| **එකතුව** | 85,782,489 | 149,924,213 | | 235,706,702 | 78,001,078 | 1,105,000 | | 79,106,078 | 156,600,624 |

| වත්කම් | 2011.01.01 දිනට පිරිවැය | වර්ෂය තුලදී මිලදී ගැනීම් | බැහැර කිරීම් | 2011.12.31 දිනට පිරිවැය/ ක්ෂයවිම් නැත. | 2011.01.01 දිනට සමුච්ඡිත ක්ෂයවීම් | වර්ෂය තුළ ක්ෂයවීම් | වර්ෂය තුළ ඉවත් කළ ණය | 2011.12.31 දිනට සමුච්ඡිත ක්ෂයවීම් | 2011.12.31 දිනට ශුද්ධ පොතේ අගය |
|---|---|---|---|---|---|---|---|---|---|
| වැඩිදියුණු නොකළ භූමිය | 1,604,663 | | - | 1,604,663 | | | | | 1,604,663 |
| භූමියට සිදුකල වැඩිදියුණුකිරීම් | 34,660,023 | | - | 34,660,023 | 27,290,969 | | | 27,290,969 | 7,369,055 |
| අනෙකුත් හිමිවූ වත්කම් | 6,672,972 | | - | 6,672,972 | 6,672,972 | | | 6,672,972 | 0 |
| මේරූ තේ වගාව | 214,482,500 | 176,678,175 | - | 391,160,675 | 79,869,351 | 5,437,597 | | 85,306,948 | 305,853,727 |
| නොමේරූ තේ වගාව | 237,864,680 | 6,493,876 | 176,678,175 | 67,680,381 | | | | | 67,680,381 |
| ගොඩනැගිලි | 141,847,976 | 111,765 | - | 141,959,741 | 75,583,728 | 3,733,515 | | 79,317,243 | 62,642,498 |
| යන්ත්‍රසූත්‍ර | 94,422,769 | 623,417 | - | 95,046,186 | 75,742,069 | 3,057,835 | | 78,799,904 | 16,246,282 |
| ලීබඩු සහ සවිකිරීම් | 4,190,470 | | - | 4,190,470 | 4,129,722 | | | 4,129,722 | 60,748 |
| උපකරණ | 16,304,846 | 46,729 | - | 16,351,575 | 11,188,251 | 387,999 | | 11,576,250 | 4,775,325 |
| වාහන | 73,700,691 | 1,048,995 | - | 74,749,686 | 47,726,966 | 5,735,862 | | 53,462,828 | 21,286,858 |
| එකතුව | 825,751,591 | 185,002,958 | 176,678,175 | 834,076,373 | 328,204,028, | 18,352,808 | | 346,556,836 | 487,519,537 |
| **එකතුව** | **911,534,080** | **334,927,171** | **176,678,175** | **1,069,783,075** | **406,205,106,** | **19,457,808** | | **425,662,914** | **644,120,161** |

## 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සඳහා සටහන්

**02 වන සටහන**

| | 2011 | 2010 |
|---|---|---|
| | රු. | රු. |
| <u>බැහැර කරන ලද වත්කම්</u> | | |
| ඉන්ධන දැව | 6,190,670 | 4,985,608 |
| ඖෂධීය පැළෑටි | 430,353 | 430,353 |
| අඩු කලා - (ඉවත් කරන ලද පැලවල වටිනාකම) | (273,211) | (248,212) |
| දැව වගා පැල | 3,383,061 | 2,874,628 |
| පොල් වගාව (නොමේරූ) | 2,666,110 | 2,621,110 |
| නැවත වන වගා කිරීම | 471,762 | 251,176 |
| කුරුඳු වගාව | 1,703 | - |
| සාදික්කා වගාව | 40,811 | 40,811 |
| හිඩැස් භූමියේ පැල සිටුවීම | 18,914,714 | 17,587,824 |
| කරදමුංගු | 32,289 | 32,289 |
| පැල තවාන් සකස් කිරීම | 52,192 | 52,192 |
| ගම්මිරිස් වගාව | 1,979,513 | 1,413,118 |
| රබර් වගාව | 5,286,765 | 583,287 |
| කරාබුනැටි වගාව | 290,596 | 3,556 |
| කෝපි වගාව | 1,481,191 | 1,372,948 |
| කෙසෙල් වගාව | 238,592 | 238,592 |
| සේර වගාව | 561,193 | 431,718 |
| ඉගුරු වගාව | 371,238 | |
| මානා වගාව පවත්වාගෙන යාම | 43,130 | |
| **එකතුව** | **42,162,674** | **32,671,001** |

**03 වන සටහන**

**කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ**

| | | |
|---|---|---|
| නව විදුලි සැපයීම් | 222,532 | 66,882 |
| සිවිල් ඉදිකිරීම් | 1,584,112 | 1,089,496 |
| අඩුකලා - ක්ෂයවීම් හා ඉවත් කිරීම් | | (25,000) |
| **එකතුව** | **1,806,644** | **1,131,378** |

**04 වන සටහන**

**තොගය වර්ෂ අවසානයේ**

| | | |
|---|---|---|
| තොග පසුව උපලබ්ධි වටිනාකමට (කොළඹ වෙන්දේසිය) | 60,153,545 | 45,236,756 |
| නොවිකුණු තේ තොග | 6,565,000 | 27,709,928 |
| නොසැසඳූ තේ තොග | | 5,522 |
| **එකතුව** | **66,718,545** | **72,952,206** |

## 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සඳහා සටහන්

| | 2011 | 2010 |
|---|---|---|
| | රු. | රු. |
| **05 වන සටහන** | | |
| **තොග** | | |
| තවාන් පැල | 4,206,733 | 3,188,633 |
| පාරිභෝගික ද්‍රව්‍ය | 2,062,815 | 4,597,252 |
| අබිලි ද්‍රව්‍ය | 23,036 | 2,003 |
| පොහොර | 3,739,947 | - |
| විවිධ බෝග | 254,807 | - |
| **එකතුව** | **10,287,338** | **7,787,888** |
| **06 වන සටහන** | | |
| **තැන්පතු** | | |
| කාර්මික ආරාවුල් සඳහා වන තැන්පතු | | 2,455,251 |
| ඇප තැන්පතු | 10,000 | 139,983 |
| සේ.අ.අ. නඩු සඳහා තැන්පතු | 67,270,625 | 81,752,034 |
| පොහොර සමාගම් වෙත ගෙවන ලද අත්තිකාරම් | | 9,500,000 |
| පාරිතෝෂිත සඳහා තැන්පතු | 1,500,000 | |
| **එකතුව** | **68,780,625** | **93,847,267** |
| **07 වන සටහන** | | |
| **ණයගැතියෝ** | | |
| විවිධ ණයගැතියෝ | 3,047,694 | 3,047,694 |
| අඩුකළා : අඩමාන ණය සඳහා වෙන්කිරීම් | (1,591,349) | (1,591,349) |
| නිෂ්පාදන ණයගැතියෝ | 880,434 | |
| නිෂ්පාදන තොග ණයගැතියෝ | 752,520 | 752,520 |
| ඉඩම් බදු ණයගැතියෝ | | 29,303,638 |
| පාරිභෝගික ණයගැතියෝ | 41,071,407 | 41,071,407 |
| විවිධ ආදායම් ණයගැතියෝ | 2,588,530 | 2,588,530 |
| ජනවසම පෙර ගිණුම් ශේෂය | 1,668,269 | 1,668,269 |
| ජනවසම - වාහන භාවිත ගිණුම | | 6,432,000 |
| වෙස්ටර්න් තැරැව්කරුවන් | | 39,268 |
| සමාජීය හා සුභසාධන ව්‍යාපෘති 11 | 38,000 | 38,000 |
| පර්ත් වතු ජංගම ගිණුම | 16,321,251 | 38,533,429 |
| ඇල්කඩුව වැවිලි සමාගම - වාහන භාවිතය | | 1,127,000 |
| අන්තර් වතු ගිණුම | 176,263 | 197.640 |
| වෙනත් ණයගැතියෝ වතු | 2,125,412 | 3,906,647 |
| පාරිභෝගික දෙපාර්තමේන්තුව | 33,055 | |
| වලහන්දූව ගිණුම | 17,653,477 | |
| ප්‍රාදේශීය කාර්යාලය | 419,111 | |
| ගස් ටෙන්ඩර් ණයගැතියෝ | 31,669,580 | |
| ප්‍රාදේශීය කාර්යාලයේ අවිනිශ්චිත ගිණුම | 3,698,841 | |
| | **120,552,495** | **127,114,692** |
| **එකතුව** | | |

## 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සඳහා සටහන්

**08 වන සටහන**

**ලැබිය යුතු මුදල්**

| | 2011 | 2010 |
|---|---|---|
| | රු. | රු. |
| චෙක්රෝල් සහ කාර්ය මණ්ඩලයෙන් ලැබිය යුතු මුදල් | 16,490,600 | 4,548,427 |
| උත්සව අත්තිකාරම් - ප්‍ර.කා. ු වතු | 50480 | 16,339,021 |
| වැටුප් අත්තිකාරම් | 2,000 | |
| කුලී ගෙවීම් මුදල් | 15,780,848 | 15,780,848 |
| අත්තිකාරම් ගෙවීම් ගිණුම | 152,271 | 209,000 |
| එකතු කල අගය මත බදු | 47,263 | 47,263 |
| මාර්ගස්ථ බිල්පත් - වතු | | 685,413 |
| පොත් ණය | 57,500 | 3,300 |
| පැමිණීමේ ප්‍රසාද දීමනා | 89,250 | 89,250 |
| ඉංගිරිය ජංගම ගිණුම | 20,255 | 612,284 |
| වන කළමනාකරණ (පූර්ව ගෙවීම්) | | 1,484,340 |
| සහකාර වතු අධිකාරි - හාගල | | 67,019 |
| වාහන වෙන්දේසිය | | 49,905 |
| දැව ටෙන්ඩර් ණයගැතියෝ | | 5,852,000 |
| විශේෂ අත්තිකාරම් | 38,732 | |
| **එකතුව** | **32,729,199** | **45,768,070** |

**09 වන සටහන**

**මුදල් හා මුදල් සමාන දෑ**

| | 2011 | 2010 |
|---|---|---|
| තැපැල් අග්‍රිමය - වතු | 5,775 | 4,347 |
| මාර්ගස්ථ චෙක්පත් | 7,070,327 | 7,087,851 |
| අතේ ඇති මුදල් - වතු | 19,537 | 19,558 |
| බැංකුවේ ඇති මුදල් - වතු | 202,832 | 601,044 |
| ලංකා බැංකු ඉතිරි කිරීම් ගිණුම් අංකය 2349701 | 14,400 | 14,400 |
| විධායක නොවන වෛද්‍ය ගිණුම් අංකය 2327539 | 261,219 | 148,667 |
| ලංකා බැංකු හයිඩ් පාක් ගිණුම් අංකය 2327549 | (1,800,725) | (178,808) |
| ලංකා බැංකු හයිඩ් පාක් ගිණුම් අංකය 2327550 | (51,939,410) | (27,868,543) |
| ලංකා බැංකුව 1 වන නගර ශාඛාව ගිණුම් අංකය 933 | (45,118,812) | (30,867,519) |
| ඉතිරි කිරීමේ ගිණුම - හයිඩ්පාක් ශාඛාව | 184,500 | |
| මාර්ගස්ථ චෙක්පත් - ප්‍රධාන කාර්යාලය | 14,500 | |
| **එකතුව** | **(91,085,856)** | **(51,039,002)** |

**2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සඳහා සටහන්**

10 වන සටහන

**ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය**

| | ප්‍රාග්ධන සංචිතය | රජයේ දායකත්වය | ප්‍රදාන | ලාභය/ (අලාභය) |
|---|---|---|---|---|
| ආරම්භක ශේෂය 2011.12.31<br>ගැලපීම ප්‍ර/ කාර්යාල - ප්‍රධාන<br>ප්‍රධාන - ලැබීම් ගිණුම | 142,051,688 | 395,987,977 | 1,571,137,549<br>(1,571,137,549) | (2,399,016,154)<br>1,571,137,549 |
| ශේෂය 2011.12.31 | 142,051,688 | 395,987,977 | | (827,878,605) |
| ඉදිරියට ගෙනා ශේෂය<br>ලාභ/ අලාභ විසර්ජනය ගිණුම | 142,051,688 | 395,987,977 | | (827,878,605))<br>(52,413,476) |
| 2011.12.31 දිනට ශේෂය | **142,051,688** | **395,987,977** | | **(880,292,080)** |

11වන සටහන

| | 2011<br>රු. | 2010<br>රු. |
|---|---|---|
| **විලම්බිත වගකීම** | | |
| පාරිතෝෂිත අරමුදල වතු ගිණුම | 378,215,636 | 269,164,378 |
| පාරිතෝෂිත අරමුදල - ප්‍රධාන කාර්යාලය ගිණුම | 8,018,411 | 6,170,155 |
| ගෙවා අවසන් කරන ලද පාරිතෝෂිත | (61,319,271) | (80,571,861) |
| **එකතුව** | **324,914,776** | **194,762,672** |

**2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සඳහා සටහන්**

| | 2011 | 2010 |
|---|---|---|
| | රු. | රු. |
| 12 වන සටහන | | |
| **ණයහිමියෝ හා ගෙවිය යුතු වියදම්** | | |
| විවිධ ණයහිමියෝ - වතු හා ප්‍ර.කා. ගිණුම | 46,004,480 | 32,418,890 |
| තැරැව්කරුවන් ගිණුම | 56,696,553 | 75,698,253 |
| ප්‍රතිපූර්ණය කල යුතු ටෙන්ඩර් තැන්පතු | 6,846,577 | 5,762,303 |
| අවිනිශ්චිත රඳවාගැනීම් | 58,556 | 1,370,310 |
| වතු ජංගම ගිණුම් | 8,152,941 | 7,869,111 |
| ජනවසම ජංගම ගිණුම | 107,709,342 | 108,509,342 |
| පර්ත් වත්ත ජංගම ගිණුම | 26,373,168 | 26,373,168 |
| අවිනිශ්චිත බිල්පත් | 967,451 | |
| පීපල්ස් ලීසිං සමාගම | 204,290 | 514,339 |
| පීපල්ස් මර්චන්ට් සමාගම | 3,687,500 | 5,310,000 |
| පොහොර සංස්ථාව | 35,931,679 | 40,214,434 |
| කුලී අත්තිකාරම්- ඔපල්ගල්ල | 4,480,000 | 4,480,00 |
| පොළී කොමිස් | 4,800,000 | |
| ඇල්කඩුව වතු සමාගම | 172,137 | 172,137 |
| මහජන බැංකු ණය ගිණුම | 1,286,623 | 9,006,358 |
| හලාවත වැවිලි සමාගම | 20,000,000 | 20,000,000 |
| සෙන්ට්‍රල් ෆයිනෑන්ස් සමාගම | | 3,225,941 |
| උඩපුස්සැල්ලෑව වතුයාය | | 2,500,000 |
| ප්‍රාදේශීය කාර්යාල ගිණුම | | 40,262,039 |
| දැව අත්තිකාරම් | 16,826,000 | |
| **එකතුව** | **340,197,298** | **383,686,625** |
| | | |
| **එකතු වූ හා ගෙවිය යුතු** | | |
| විගණන ගෙවීම් ප්‍රතිපාදන | 2,551,884 | 2,024,850 |
| සේ.අ.අරමුදල - වතු | 370,250,385 | 316,852,477 |
| සේ.භා.අරමුදල | 19,932,218 | 9,329,007 |
| ගෙවිය යුතු බදු | | 693 |
| ගෙවිය යුතු පැමිණීමේ ප්‍රසාද දීමනා | 2,767,773 | |
| එකතු වූ වියදම් | 2,655,701 | 2,372,897 |
| මුදල් පරිවහන රක්ෂණ | 728,674 | |
| ගෙවිය යුතු ESPS | 2,546,682 | 787,472 |
| ගෙවිය යුතු CPPS | 711,442 | 342,680 |
| ගෙවිය යුතු වැටුප් අඩුකර ගැනීම් | 75,534 | 52,443 |
| සුභසාධක සංගමය | 1,102 | 29,547 |
| කාර්යමණ්ඩල හා සේවකයින්ට ගෙවිය යුතු | 55,566,640 | 48,284,790 |
| වෘත්තීය සමිති | 1,619,348 | 794,635 |
| ගෙවියයුතු පාරිතෝෂිත | 166,384,256 | 103,247,314 |
| ගෙවිය යුතු වෛද්‍ය රක්ෂණ ගාස්තු | 229,225 | |
| **එකතුව** | 626,020,865 | **484,118,805** |
| | **966,218,163** | **867,805,430** |

## 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය සඳහා සටහන්

| | 2011 රු. | 2010 රු. |
|---|---|---|
| **13 වන සටහන** | | |
| **විකුණුම් ආදායම - තේ** | | |
| ශුද්ධ තේ විකුණුම් - කොළඹ වෙන්දේසිය | 428,042,279 | 499,907,752 |
| වතුවල තේ විකුණුම් | 8,090,510 | |
| තේ විකුණුම් - ආරම්භක තොගය | 56,218,138 | |
| කසල තේ | 774,499 | 1,583,650 |
| එකතුව | **493,125,426** | **501,491,402** |
| **14 වනසටහන** | | |
| **විකුණුම් ආදායම - සුළු භෝග** | | |
| ශුද්ධ කරදමුංගු විකුණුම් | 2,237,000 | 794,821 |
| ශුද්ධ කරාබුනැටි විකුණුම් | 1,916,137 | 3,287,649 |
| ශුද්ධ ගම්මිරිස් විකුණුම් | (2,900) | 111,634 |
| ශුද්ධ කෝපි විකුණුම් | (29,290) | (113,997) |
| ශුද්ධ සාදික්කා විකුණුම් | 2,272 | (138,541) |
| එකතුව | **4,123,220** | **3,941,565** |
| **15 වන සටහන** | | |
| **ආදායම් - වතු** | | |
| තේ ටෙන්ඩර් කටයුතු | 132,098,711 | 37,530,860 |
| වලහන්දුව ශුද්ධ ලාභය | 16,560,055 | 8,259,799 |
| අබලි ද්‍රව්‍ය විකිණීම | 13,030,946 | |
| විවිධ ආදායම් | 7,586,952 | 31,890,763 |
| වැටුප් අධි ප්‍රතිපාදන | | 1,119,931 |
| කුලී ආදායම | 21,922,054 | 31,232,849 |
| නැවත නොගෙවනු ලබන ටෙන්ඩර් ආදායම | 2,400,000 | 261,874 |
| ලැබුණු ලියාපදිංචි ගාස්තු | 868,200 | 271,400 |
| කළමනාකරණ ආදායම | 23,353,728 | 16,241,819 |
| අධි ප්‍රකාශිත සටහන් | | 7,005,627 |
| පාරිතෝෂිත අධි ප්‍රතිපාදන | | 21,716,090 |
| සුපරීක්ෂණ ගාස්තු | | 145,715 |
| VP පැල විකිණීම | 171,089 | 384,963 |
| **එකතුව** | **217,991,734** | **156,061,689** |

**2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය සඳහා සටහන්**

16 වන සටහන

<u>මානව සම්පත් පිරිවැය</u>

| | 2011 රු. | 2010 රු. |
|---|---|---|
| සභාපති දීමනා | 774,365 | 435,806 |
| අධ්‍යක්ෂ මණ්ඩල දීමනා | 309,500 | 432,500 |
| ප්‍ර/කා, ප්‍රා/කා වැටුප් | 20,273,323 | 18,896,085 |
| දීමනා | 34,371 | 43,125 |
| පැමිණීමේ දිරි දීමනා | | 49,350 |
| CPPS දායකත්වය 12% | 517,055 | 103,958 |
| E.P.F.දායකත්වය 12% | 536,974 | 518,738 |
| ESPS දායකත්වය 12% | 816,168 | 764,118 |
| E.T.F දායකත්වය 3% | 491,528 | 482,057 |
| වසර සඳහා පාරිතෝෂිත ප්‍රතිපාදන | 2,686,334 | 883,867 |
| අතිකාල දීමනා | 347,558 | 349,691 |
| **එකතුව** | **26,787,175** | **22,959,294** |

17 වන සටහන

<u>පරිපාලන වියදම්</u>

| | | |
|---|---|---|
| ප්‍රචාරණය | 323,318 | 370,834 |
| විගණන ගාස්තු | 135,490 | 164,535 |
| ලියාපදිංචි ගාස්තු | 687,013 | 40,680 |
| පරිත්‍යාග | 390,464 | 422,500 |
| විදුලිය | 432,840 | 478,150 |
| සංග්‍රහ කටයුතු | 201,072 | 194,918 |
| විධායක කාර්යමණ්ඩල වෛද්‍ය රක්ෂණය | 358,711 | 195,863 |
| විධායක නොවන කා.ම. වෛද්‍ය රක්ෂණය | 979,363 | 812,539 |
| නෛතික ගාස්තු | 2,863,941 | 1,749,843 |
| රථවාහන නඩත්තු | 1,202,381 | 2,488,276 |
| කාර්යාල උපකරණ නඩත්තු | 146,022 | 257,096 |
| කාර්යාල නඩත්තු | 38,469 | 177,697 |
| තක්සේරු ගාස්තු | 37,870 | 270,310 |
| තැපැල් සහ කුරියර් ගාස්තු | 142,599 | 117,597 |
| ප්‍රාදේශීය කාර්යාලයේ වියදම් | | 657,775 |
| කාර්ය මණ්ඩල සුභසාධනය - තේ | 435,045 | 84,167 |
| මුද්දර බද්ද | 505,675 | 106,000 |
| ලිපි ද්‍රව්‍ය | 573,768 | 463,386 |
| විවිධ වියදම් | 218,313 | 1,100,365 |
| දුරකථන වියදම් | 382,778 | 488,148 |
| ගමනාගමන සහ යැපීම් දීමනා | 551,453 | 373,379 |

**2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය සඳහා සටහන්**

| 17 වන සටහන(**සම්බන්ධයි)** | 2011 | 2010 |
|---|---|---|
| රු. | රු. | |
| වාහන කල්බදු කුලී | 13,692 | 250,645 |
| ජල බිල්පත් | 24,500 | 83,711 |
| වැඩමුළු හා පුහුණු වැඩසටහන් | | 3,800 |
| පවිත්‍රතා සේවය | 44,148 | 42,553 |
| ක්ෂයවීම් | 1,105,000 | 2,690,412 |
| සේ.අ.අ. අධිභාරය | 5,185,092 | 3,855,065 |
| කාර්යාල කුලිය | 2,651,100 | 550,000 |
| ත්‍රස්ත පීඩන සඳහා | 238,000 | 373,727 |
| බදු වර්ග | 169,999 | 166,878 |
| ගල්පිහිල්ල බංගලාව නඩත්තු | 936,701 | 672,145 |
| මෝටර් රථ කල්බදු පොළිය | 462,531 | 1,488,798 |
| බැංකු ණය පොළිය | 73,481 | 1,544,602 |
| බදු ගෙවීම් | 18,000 | |
| වන්දි | 133,549 | |
| ලිපිලේඛන හා සන්නිවේදනය | 3,014,932 | 2,723,739 |
| විගණන ගාස්තු | 519,600 | 519,600 |
| නෛතික ගාස්තු | 600,093 | 265,034 |
| කළමනාකරණ ගාස්තු | 23,008,395 | 15,890,666 |
| පාරිතෝෂිත | 19,842,293 | 19,397,930 |
| ගබඩා කුලී | 2,418,088 | 2,430,477 |
| විවිධ වියදම් | 2,417,052 | |
| රක්ෂණය | 26,863 | 5,146 |
| අඩු කිරීම් - පොදු පිරිවැය අධි වෙන්කිරීම් | (12,215,142) | (16,037,984) |
| **එකතුව** | **61,294,550** | **47,931,000** |

18 වන සටහන

**<u>මූල්‍ය වියදම් - වතු</u>**

| | | |
|---|---|---|
| මුදල් පරිහරණ කොමිස් වතු | 4,940,271 | 4,803,826 |
| හර බද්ද | 51,188 | 698,683 |
| තැරැව්කරු පොළිය | 16,587,161 | 15,937,120 |
| බැංකු ගාස්තු | 9,263,188 | 5,863,833 |
| මුදල් ප්‍රවාහන ගාස්තු | 30,632 | 19,556 |
| **එකතුව** | **30,872,441** | **27,323,019** |

## ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව - ගිණුම්කරණ ප්‍රතිපත්ති - 2011

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව 1958 අංක 04 දරන පනතින් ස්ථාපිතය. 2011 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා සංස්ථාවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශය තුළ ප්‍රධාන කාර්යාලයේ, ප්‍රාදේශීය අධ්‍යක්ෂ කාර්යාලයේ (මහනුවර) හා සංස්ථාව විසින් කළමනාකරණය කරනු ලබන වතු යාය 12ක ක්‍රියාකාරකම් ඇතුළත්ය.

**1.** තොරතුරු

**1.1.** ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ස්වභාවය

තේ, රබර් හා සුළු බෝග වගා කිරීම හා නිෂ්පාදනය කළමනාකරණය කිරීම ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ ප්‍රධාන කාර්යය වේ. වතු යායයන් විසින් සිය නිෂ්පාදන කොළඹ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**1.2.** මුදල් වර්ෂය

සංස්ථාවේ මුදල් වර්ෂය සෑම වසරකම දෙසැම්බර් 31 වනදායින් අවසන් වේ

**1.3.** ලියාපදිංචි කාර්යාලය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති ලිපිනය අංක 11, ආදිපාද වීදිය, කොළඹ 01

**1.4.** දනට සේවයේ නියුතු සේවක සංඛ්‍යාව

| වතු | | ප්‍රධානකාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල | |
|---|---|---|---|
| අධිකාරි | 12 | සභාපති | 01 |
| සහකාර අධිකාරි | 18 | විධායක අධ්‍යක්ෂ | 01 |
| කර්මාන්තශාලා හා කාර්යාල කාර්යමණ්ඩල | 174 | ක්‍රියාකාරී අධ්‍යක්ෂ | 01 |
| නඩත්තු හා සහාය කාර්ය මණ්ඩල | 100 | සාමාන්‍යාධිකාරී | 01 |
| | | මධ්‍යමමට්ටමේකළමනාකරුවන් (FM)- | 01 |
| | | කනිෂ්ඨ කළමනාකරුවන් | 04 |
| | | කළමනාකරණ සහකාර | 30 |
| | | පහළ ශ්‍රේණි | 11 |
| උප එකතුව | **304** | | **50** |

දනට සේවයේ නියුතු මුළු සේවක සංඛ්‍යාව **354**

.1.5. 2010 දෙසැම්බර් 31 දින වන විට වතු සේවක සංඛ්‍යාව හා ජනගහනය

| | |
|---|---|
| පුරුෂ | 1,895 |
| ස්ත්‍රී | 2,685 |
| ජනගහනය | 28,930 |

1.6. වගා කොට ඇති මුළු හෙක්ටයාර් ප්‍රමාණය VP

| | | |
|---|---|---|
| තේ | 1058.00 | |
| පැළ | 2539.35 | 3597.35 |
| රබර් | | 10.00 |
| මුළු සුළු බෝග | | 1701.32 |
| තේ තවාන් | | 12.35 |
| දැව ඉන්ධන / දැව | | 1313.97 |
| වනය/අතහැර දමන ලද/ වෙනත් ඉඩම් | | 3184.24 |
| එකතුව | | **9819.23** |

**2. විශේෂ වැදගත්කමක් සහිත ගිණුම් ප්‍රතිපත්ති වල සාරාංශය**

2.1. මූල්‍ය ප්‍රකාශ සකස් කෙරෙනුයේ ශ්‍රී ලංකා රුපියල් වලිනි

2.2. ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා සම කොටස් හි වෙනස්කම් සකස් කරනුයේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් සකස් කොට ඇති පොදුවේ පිළිගනු ලැබූ ගිණුම් ප්‍රතිපත්ති හා ගිණුම් ප්‍රමිති වලට අනුකූලව ය.

මෙම ගිණුම් ප්‍රකාශ වලට බලපානු ලබන උද්ධමන සාධකය සඳහා වන ගැලපීම් කිසිවක් සිදු කොට නොමැත.

2.3. ශ්‍රී ලං රා වැ ස විසින් මෙම ගිණුම් ප්‍රතිපත්ති හැම විටම භාවිතයට ගෙන ඇති අතර ඒවා පසුගිය වසරේ ක්‍රමවේදය සමගද අනුකූල වේ. සමාලෝචිත වසරේ ඉදිරිපත් කිරීම් තහවුරු කිරීම සඳහා ශ්‍රී ලං රා වැ ස පසුගිය වසරේ සංඛ්‍යා දත්ත සහ වාක්‍ය ඛණ්ඩ සුදුසු පරිදි නැවත සකස් කොට ඇත.

2.4. ශේෂ පත්‍ර දිනයෙන් පසු ඇතිවන සිදුවීම් වල භෞතිකත්වය සැලකිල්ලට ගෙන ඇති අතර අවශ්‍ය පරිදි වන ගැලපීම් ගිණුම් වල සිදු කොට ඇත

2.5 අදාල ගිණුමේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමෙන් අනතුරුව ගිණුම්වල දැක්වෙන ඉදිරියට ගෙන ආ අක්‍රිය ශේෂයන් සසඳා ඇත. මෙම කාර්යය සඳහා නොසැසඳූ හර ශේෂයන් අවසන් කිරීම සිදු කිරීමට වැවිලි අංශයේ කාර්ය මණ්ඩල හා ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය එක්ව කටයුතු කර ඇත.

**3. ස්ථාවර වත්කම් තක්සේරුව**

3.1 ස්ථාවර වත්කම් සටහන් කරනුයේ ඓතිහාසික පිරිවැය වත්මන් ක්ෂයවීම් හා සැසඳීමෙන් අනතුරුවය.

3.2 වත්කම්වල අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයුකාලය ස්ථාවර වත්කම්වල පිරිවැයෙන් / වටිනාකමින් කපා හැරීම සඳහා ක්ෂයවීම් සෘජු රේඛා පදනමින් දක්වා ඇත. මිලදී ගැනීමේ වසරේදී ක්ෂය වීම අය කොට ඇත.

ඉඩම් හා නොමේරූ වගාවන් සඳහා ක්ෂයවීම් ගණනය කොට නොමැත. අදාළ ප්‍රතිශතයන් පහත දැක්වේ.

| | |
|---|---|
| • ගොඩනැගිලි | 5% |
| • යන්ත්‍රෝපකරණ | 12.5% |
| • රථවාහන | 25% |
| • උපකරණ | 12.5% |
| • ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 12.5% |
| • මේරූ වගාවන් | 2% |
| • පරිගණක මෘදුකාංග | 33% |

**3.3** රජයේ තක්සේරුකරු විසින් ලබා දුන් තක්සේරුව මත පදනම්ව දෙමටගොඩ ඉඩමේ වටිනාකම මෙම වසරේ ඉඩම් වටිනාකම වෙත ගෙනැවිත් ඇත. මෙම ඉඩමේ ඉහළ දමන ලද වටිනාකම හිග ගිණුමේ ඉදිරියට ගෙන ආ ශේෂයෙන් අඩු කොට ඇත.

**4. ජංගම වත්කම්**

4.1 ඉන්වෙන්ටරි

කොළඹ වෙන්දේසි වෙළඳ පොලේදී විකුණූ නිපැයුම් තොග සහ නොවිකුණූ තොග ශ්‍රී ලං රා වැ ස හි ඉන්වෙන්ටරි තුළ ඇතුළත් වේ. ශ්‍රී ලං ග ප්‍ර 32 අනුව වෙළඳපොලේදී විකුණූ ප්‍රමාණය පදනම් කොට ගෙන තොග තක්සේරු කොට ඇත.

**4.2 තොග - යෙදවුම් හා පාරිභෝගික ද්‍රව්‍ය**

වසර අවසානයේදී භෞතික සත්‍යාක්ෂණය පළමුව පැමිණ පළමුව පිටවන පදනමින් සිදු කොට ගබඩා වල ඇති තොග පොත් වටිනාකමින් දක්වා ඇත.

**4.3 ණයකරුවන්, තැන්පතු හා අයවිය යුතු මුදල්**
බොල් ණය ලෙස හඳුනාගනු ලැබූ සුළු ණයකරුවන් එම මුදල් ප්‍රමාණයන්ද සමග දක්වා ඇත. සමාලෝචන වර්ෂය තුළ කිසිදු බොල් ණයක් කපා හැර නොමැත.

**4.4 මුදල් හා මුදල් ආදේශක**
මුදල් හා මුදල් ආදේශක ඉතිරි කිරීමේ හා ජංගම ගිණුම් වල දමා ඇති මුදල්, සංක්‍රාන්ති මුදල් හා බැංකුවේ ඇති මුදල් ලෙස දක්වා ඇතග

**5. වගකීම් සහ ප්‍රතිපාදන**

**5.1 විලම්භනය කරන ලද වගකීම්**
විශ්‍රාම යන සේවකයන් සඳහා වන පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන සලසා ඇත. 1992 අංක 62 දරණ පාරිතෝෂිත පනතේ විධිවිධාන වලට අනුකූලව අදාල සේවා කාලය සපුරන සියළු සේවකයන් සඳහා මෙම ප්‍රතිපාදන සකසා ඇත

**5.2 වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු මුදල්**
භෞතික සහ ශේෂපත්‍ර දිනයට විශේෂ වැදගත්කමක් සහිත වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු මුදල්, ගිණුම් වල ශේෂ පත්‍ර තුළ දක්වා ඇත. වගකිම් සඳහා වන ප්‍රමාණවත් ප්‍රතිපාදන එකතු වන පදනමින් සපයා ඇත

**6. ආදායම් ප්‍රකාශය**

**6.1 ආදායම**

**6.1.1. ආදායම හඳුනාගැනීම**
ආදායම හඳුනාගැනෙනුයේ එකතු වන පදනමිනි. 2011 ජනවාරි 1 දා සිට දෙසැම්බර් 31 දා දක්වා කාලය තුළ වන සේවාවන්ගෙන් ලත් ආදායම එම වසරේ ආදායම ලෙස හඳුනාගෙන ඇත

**6.1.2. වෙළඳ ආදායම - තේ**
කොළඹ තේ වෙන්දේසියෙන්, තේ වතු වලින් විකුණනු ලබන තේ වලින්, තේ මධ්‍යස්ථානවලින් විකුණනු ලබන තේ වලින් හා වතු වලින් කසල තේ ලෙස විකුණනු ලබන තේ වලින් ලැබෙන ආදායම මුළු තේ ආදායම ලෙස ගණනය කෙරේ

**6.1.3. සුළු බෝග වලින් ලැබෙන ආදායම**
කරදමුංගු, කරාබුනැටි, ගම්මිරිස් හා කෝපි වතු වල වගා කෙරෙන සුළු බෝග වේ. අස්වනු නෙලීමේ ශ්‍රම වියදම අවම කර ගැනීම සඳහා විශාල ප්‍රමාණයේ කොටස් විකිණීමේ ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරනු ලැබේ.

**6.1.4. දැව විකිණීමෙන් ලද ආදායම**
වසර 30කට පමණ පෙර සිටවන ලද දැවමය ශාක විකිණීම ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කිරීම හරහා සිදු කෙරේ. 2011 දෙසැම්බර් මාසයේදී එම වසර තුළ ටෙන්ඩර් ඉදිරිපත් කිරීමෙන් ලද ආදායම එකතු කිරීමේ පදනමින් දක්වා ඇත.

**6.1.5 වෙනත් ආදායම් - ප්‍රධාන කාර්යාලය හා වතු**
කල්බදු ක්‍රමය යටතේ ලබා දී ඇති ඉඩම් හා වතු යාය වලින් ලැබෙන ආදායම එකතු වන පදනමින් ප්‍රධාන කාර්යාලයේ හා වතු වල වෙනත් ආදායම් ලෙස දක්වා ඇත

**6.2. වියදම්**
වසරේ ලාභය සඳහා සංස්ථාවට ලැබෙන ආදායමෙන් නිෂ්පාදනය, පරිපාලනය හා වත්කම් නඩත්තුව සඳහා වන සියළු වියදම් අය කර ගෙන ඇත. එකතු වූ සියලු වියදම් ඊළඟ වසරේ මුළු ලාභය / පාඩුව ගණන් ගැනීමේ දී සැලකිල්ලට ගෙන ඇත.

## විගණකාධිපති දෙපාර්තමේන්තුව

එල්එස්/ජ/එස්එල්පීසී/එෆ්ඒ/2011
2013 මාර්තු 27 දින

සභාපති,
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 23 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වර්තාවක් සංස්ථාවේ සභාපති වෙත 2012 අගෝස්තු 07 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වන ලද විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම ඡේදයේ දැක්වෙන කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සපයා ගැනීමට ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය.

### 1.4 මතය ව්‍යාවනය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.3.1 සිට 2.3.6 ඡේදය දක්වා ඇති කරුණු වල ප්‍රතිඵලයක් ලෙස ආදායම් ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තා ගතවූ හෝ වාර්තා ගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකි විය.

## 2 මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය ව්‍යාවනය

මෙම වාර්තාවේ 2.3.1 සිට 2.3.6 ජේද වල දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 2.2 වැවිලි කළමනාකරණය ප්‍රතිව්‍යුහගත කිරීම

1992 ජූනි දක්වා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, ප්‍රාදේශීය කාර්යාල හයක් සමග එක්ව වතු 242 ක් කළමනාකරණය කරන ලදී. 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ රජයට පවරා ගත් ව්‍යාපාරික ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීම පිළිබඳ පනත යටතේ ප්‍රාදේශීය කාර්යාල 05 ක් යටතේ වූ වතු 209 ක් 1992 ජූනි සිට කළමනාකරණය සඳහා වතු සමාගම් 23 කට පවරා තිබුණු අතර, වතු 12 ක් 1993 ජූලි සිට පෞද්ගලික අංශය වෙත පවරා තිබුණි. සංස්ථාව සතු ඉතිරි වතු අතරින් වතු 12 ක් වතු 06 ක් ලෙස ඒකාබද්ධ කිරීමෙන් අනතුරුව එක් වත්තක් 1999 දී පෞද්ගලික අංශයටද, 2002 නොවැම්බර් මාසයේදී එක් වත්තක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙතද 2003 දී වතු දෙකක් බදු කුලී පදනම මත පුද්ගලික අංශය වෙත පවරා තිබුණි. මේ අතර 2004 ඔක්තෝබර් මාසයේදී පෞද්ගලික අංශය වෙත පවරන ලද වතු අතරින් එක් වත්තක් සංස්ථාව යටතට පවරා ගන්නා ලදී. ඒ අනුව 2011 වර්ෂය අවසාන වන විට ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් ගල්පිහිල්ලේ ප්‍රාදේශීය කාර්යාලය සමග එක්ව වතු 12 ක කළමනාකරණය අඛණ්ඩව කරගෙන යනු ලැබීය.

### 2.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම

| | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට යොමුව | | විස්තරය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 | | පාරිතෝෂිත වෙන්කිරීමේදී සේවකයෙකුට සේවයට බැඳුන වර්ෂයේ සිට පාරිතෝෂිත වෙන්කිරීම් කළයුතු වුවද ප්‍රධාන කාර්යාලය හැර පාරිතෝෂිත වෙන්කරනුයේ සේවාකාලය වසර 05 සම්පූර්ණ කළ සේවකයින්ට පමණි |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 18 | (i) | වත්කම් ප්‍රත්‍යාගණනයෙන් එහි අගය වැඩි වීමක් සිදුවූයේ නම් එම වැඩි වූ අගය ප්‍රත්‍යාගණන සංචිතයක් ලෙස ස්කන්ධය යටතේ වෙනම දැක්විය යුතුය. එසේ වුවද, දෙමටගොඩ ඉඩම හා ගොඩනැගිල්ල සඳහා ආයතනය විසින් ප්‍රත්‍යාගණනය අතිරික්තය වූ රු.147,613,495 ක අගය ලාභාලාභ විසර්ජන ගිණුමට ගලපා තිබුණි. |
| | | (ii) | එක් අයිතමයක් ප්‍රත්‍යාගණනය කළ විට අදාල මුළු වත්කම් කාණ්ඩයම ප්‍රත්‍යා-ගණනය කළ යුතු වුවද එසේ කර නො තිබුණි. |

(iii) වත්කම් එක් අවස්ථාවකදී මිලදී ගත් වර්ෂයේ සිට ක්ෂය කර තිබූ අතර තවත් අවස්ථාවලදී මිලදී ගත් වර්ෂයට පසු වර්ෂයන්හිදි ක්ෂය කර තිබුණි. ඒ අනුව ආයතනය විසින් වත්කම් ක්ෂය කිරීමේදී ඒකාකාරී ප්‍රතිපත්තියක් අනුගමනය කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) ගිණුම්කරණ ප්‍රමිති අංක 24 රාජ්‍ය ප්‍රදානයන් පිළිබඳ ගිණුම් තැබීමේදී එම ගිණුම්කරණ පිළිවෙත හා එම ප්‍රදානයන්ගේ ශේෂය අවසන් ගිණුම්වල පෙන්වනු ලබන ආකාරය පිළිබඳව ආයතනයේ ගිණුම් ප්‍රතිපත්ති මගින් හෙලි දරව් කර නොතිබුණි.

### 2.3.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ප්‍රධාන කාර්යාලයේ සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂිත වෙන් කිරීම් රු.500,000 ක් වැඩියෙන් ගණනය කර දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වතු සේවකයින්ගේ වැටුප් වැඩිවීම මත ගණනය කරනු ලැබූ පාරිතෝෂිත වෙන්කිරීම් ලාභලාභ ගිණුමට හර කරනවා වෙනුවට රු.82,275,798 ක ප්‍රමාණයක් පාරිතෝෂිත අවිනිශ්චිත ගිණුමටද රු.4,473,846 ක ප්‍රමාණයක් පාරිතෝෂිත වෙන්කිරීමේ ගිණුමකටද හර කර තිබුණි.

(ඇ) පාරිතෝෂිත අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය වූ රු.162,847,658 හා පාරිතෝෂිත වෙන්කිරීම් ගිණුමේ හර ශේෂය වූ රු.8,826,845, ශේෂ පත්‍රයේදී පාරිතෝෂිත ගෙවීම් ලෙස දක්වා තිබුණි.

(ඈ) ඒකාබද්ධ ශේෂ පත්‍රයේ පාරිතෝෂිත දැක්වීමේදී වතුවල එකතුව හා ප්‍රධාන කාර්යාලයේ එකතුව අතර ආරම්භක ශේෂ, ප්‍රතිපාදන හා අවසාන ශේෂ අතර පිළිවෙලින් රු.384,385,791. ,රු.356,525,087 හා රු.92,249,239 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ඉ) වලහන්දුව වත්තට අදාලව ශේෂ පිරික්සුමේ දක්වා තිබූ එකතුව රු.22,636,795 ක්වූ වත්කම්ද, රු.5,921,740 ක්වූ වගකීම්ද ඒකාබද්ධ අවසන් ගිණුමේ දක්වා නොතිබුණි.

(ඊ) ලාභලාභ විසර්ජන ගිණුමේ පසුගිය වර්ෂයේ අවසාන ශේෂය රු.2,412,333,999 ක් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය වශයෙන් ඉදිරියට ගෙන ආ යුතු වුවද, එම ශේෂය රු.2,471,366,560 ක් ලෙස ඉදිරියට ගෙනවිත් තිබුණි.

(උ) භාවිතයට නොගන්නා වාහන, පැරණි කර්මාන්ත ශාලා හා යන්ත්‍ර සූත්‍ර විකිණීමෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.13,030,946 ක මුදලක් ලැබී තිබුණු අතර එම වත්කම් වලට අදාල පිරිවැය හා ක්ෂය වෙන්කිරීම් ගිණුම් වලින් ඉවත් කර අතිරික්තය හෝ ඌනතාවය ගිණුම්වලට ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සංස්ථාව විසින් බැංකුවේ තැන්පත් කර තිබුණු ස්ථාවර තැන්පතු සඳහා සමාලෝචිත වර්ෂය තුළ ලැබිය යුතු රු.250,000ක පොළිය බැංකුවෙන් ලබාගත් ණය මුදල සඳහා ගෙවිය යුතු රු.914,006 ක පොලියට හිලව් කර ගිණුම් වල දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ රු.16,000,000 ක ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු රු.1,194,471 ක් වූ පොලිය ගිණුම් ගත කර නොතිබූ අතර, රු.35,000,000 ක ස්ථාවර තැන්පතු වලට අදාල පොලිය ගණනය කර ගිණුම් ගත කර නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ ලාභලාභ ගිණුමේ හර ශේෂය රු.74,752,248 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඔ) හලාවත වැවිලි සමාගමෙන් ලබාගෙන තිබූ රු.මි.20 ක ණය මුදල සඳහා 2011 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු පොලිය රු.2,000,000 ක් ගිණුම් වල දක්වා නොතිබුණි.

(ඕ) ශේෂ පත්‍රයේ ප්‍රදාන වටිනාකම හා රඳවාගත් ලාභ ශේෂයන් වෙන වෙනම දැක්විය යුතු වුවත් එම අගයන් දෙකේ එකතුව රු.880,292,080 ක් ස්කන්ධය වෙනස්වීමේ ගිණුම ලෙස පෙන්වා තිබුණි.

## 2.3.3 නොසැසඳු පාලන ගිණුම්

--------------------

(අ) වතු 11 කට අදාලව ලෙජර් ගිණුම් 11 ක ආරම්භක ශේෂයන් පසුගිය වර්ෂයේ අවසාන ශේෂයන් සමග නොසැසඳුන අතර වෙනසේ එකතුව රු.30,744,571 ක් විය.

(ආ) වර්ෂ කිහිපයක සිට පවතින ප්‍රධාන කාර්යාලය හා වතු 11 කට අදාල අක්‍රීය ගිණුම් 34 ක හර ශේෂ වල එකතුව රු.48,142,868 ක්ද ගිණුම් 15 ක බැර ශේෂයන් වල එකතුව රු.20,484,471 ක්ද විය.

## 2.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

----------------------------

(අ) වෙළඳ ණය ගැති ශේෂය රු.66,725,225 ක් තුල වර්ෂ 1 සිට 5 දක්වා හිග හිටි ණය ශේෂ රු.15,689,806 ක්ද වර්ෂ **5** කට වැඩි හිග හිටි ණය ශේෂ රු.16,534,334 ක්ද විය. එම ණය ශේෂ වලට අදාල ණයගැති ලේඛන පවත්වා නොතිබුණ අතර, ශේෂ සනාථ කිරීම්ද ලබාගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ආයෝජන මන්ඩලයට අයත් **පර්ත්** වත්තේ ජංගම ගිණුමේ හර ශේෂය රු.16,321,251 ක් හා ස්ථාවර තැන්පතු ලෙස රු.22,252,590 ක් මූල්‍ය ප්‍රකාශන වල දැක්වුවද, එම ආයතනයේ මූල්‍ය ප්‍රකාශන වල එවැනි ශේෂ දක්වා නොතිබුණි.

(ඇ) ණය හිමි ශේෂ රු.243,990,129 ක් සඳහා ශේෂ සනාථ කිරීම් ලබාගෙන නොතිබුණු අතර, වර්ෂ 01 **සිට** 05 දක්වා හා වර්ෂ 05 ඉක්මවූ ණය හිමි ශේෂවල වටිනාකම පිලිවෙලින් රු.210,765,766 ක් හා රු.5,014,528 ක් විය.

## 2.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

--------------------------

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන පහත සඳහන් ගිණුම් විෂයයන් හා ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැතිවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| විෂයය | ගිණුම් සංඛ්‍යාව | වටිනාකම | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|---|
| ------ | -------- | -------- | ------------------- |
| ස්ථාවර වත්කම් | - | 834,076,373 | විධිමත්ව නඩත්තු කරන ලද ස්ථාවර වත්කම් ලේඛන |
| ක්‍ෂය වෙන්කිරීම්-ප්‍රධාන කාර්යාලය | - | 1,105,000 | ක්‍ෂය ගණනය කිරීමේ ලේඛන |
| ස්ථාවර හා අනෙකුත් තැන්පතු | 03 | 126,253,215 | තැන්පතු ලේඛන |
| ණය ගැතියන් | 12 | 103,894,993 | ණයගැති උපලේඛන හා ශේෂ සනාථ කිරීම් |
| ණය හිමියන් | 14 | 308,345,309 | ණයහිමි උපලේඛන හා ශේෂ සනාථ කිරීම් |

**2.3.6 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්‍ෂණය විය

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | පනත් | |
| (i) | 1971 අංක 38 දරන මුදල් පනතේ 14(1) වගන්තිය | මුදල් වර්ෂයක් අවසානයේදී කෙටුම්පත් **වාර්ෂික** වාර්තාවක් පිලියෙල කළයුතු අතර, මාස 04 ක් ඇතුලත විෂයභාර අමාත්‍ය-වරයාට හා විගණකාධිපති වෙත එහි පිටපත් ඉදිරිපත් කල යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ii) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත | මාසයක් අවසන්වී ඊළග මාසයේ 30 දිනට පෙර සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් යැවිය යුතු නමුත් වතු 12 කට අදාල රු.370,250,385 ක්වූ දායක මුදල් අරමුදල වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නො තිබුණි. |
| (iii) | 1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීම් පනත | සේවය අවසන් කිරීමෙන් පසු දින 30 ක් ඇතුලත පාරිතෝෂිත දීමනාව ගෙවිය යුතු නමුත් වතු 12 කට අදාලව රු.166,384,256 මුදලක් ගෙවීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | **ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි** | |
| **(i)** | මු.රෙ. 135 හා 135(5) | මුදල් පාලනය සම්බන්ධ කාර්යභාරයන් නිලධාරින් අතර ලිඛිතව පැවරීමට කටයුතු කර නොතිබුණු අතර වියදමක් තහවුරු කිරීම සඳහා අදාල කාර්යභාරයන් වාචිකව පැවරි ඇති නිලධාරීන් විසින්ද ගෙවීම් වවුචර්වල තම අත්සන් තබා නොතිබූ අවස්ථාද විය. |

| | | |
|---|---|---|
| **(ii)** | මු.රෙ. 371(2) (අ) හා (ඇ) | තත්කාර්ය අතුරු අග්‍රිම මාණ්ඩලික නොවන නිලධාරින්ට ලබාදී තිබුණි. |
| **(iii)** | මු.රෙ. 372 (ආ) (ඇ) | රු.20,000 ඉක්මවා අත්තිකාරම් ලබාදී තිබූ අතර කාර්ය නිමවූ වහාම අත්තිකාරම් පියවා නොතිබුණි. |
| **(iv)** | මු.රෙ. 386 | චෙක්පත් ආදායකයාගේ ගිණුමට බැරවන පරිදි ලිවිය යුතු වුවද රු.100,000 ක් වටිනා චෙක්පත මුදල් චෙක්පත් ලෙස නිකුත් කර තිබුණි. |
| **(v)** | මු.රෙ. 1645 | වාහන ලොග් සටහන් පොත් හා දෛනික ධාවන සටහන් පවත්වා නොතිබුණි. |
| | මු.රෙ. 1646 | **දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණකාධිපතිවෙතඉදිරිපත්නොකිරීම,වාහන විස්තර ඇතුළත්ලේඛනයක් පවත්වා නොගැනීම.** |

(ඇ) **ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය**

| | | |
|---|---|---|
| I. | VIII පරිච්ඡේදයේ 10.1 (අ) වගන්තිය | පැය 8 කට අඩු කාලයක් වැඩ කර 1/20 දීමනාව ලබාගෙන තිබුණි. |
| II. | VIII පරිච්ඡේදයේ 10.3 වගන්තිය හා 1997 මැයි 23 දිනැති අංක 118 (අ) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | 1/20 දීමනාව මසකට එක් දිනකට සීමාවිය යුතු වුවද නිලධාරීන් තිදෙනෙකු සඳහා මසකට එක් දිනකට වඩා ගෙවා තිබූ අතර, ඒ අනුව රු.31,682 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. |

(ඈ) **චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| (i) | 2003 ජූනි 02 දිනැති අංක PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛයට පටහැනිව අධ්‍යක්ෂවරයෙකුගේ ව්‍යාපාරික ආයතනයේ දුරකථන බිල් සඳහා රු.60,000 ක් ගෙවා තිබුණි. |
| (ii) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | වතු ආශ්‍රිතව පිහිටි ආර්ථික වටිනාකමක් සහිත ගස් පෞද්ගලික ආයතන වලට විකිණීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව කටයුතු කර තිබූ අවස්ථා විය. |

## 3 මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතු වලින් රු.52,413,476 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.14,174,680 ක ඌනතාවයක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේදී ඌනතාවය රු.38,238,796 කින් වර්ධනය වී තිබුණි. මුළු ආදායම 5% කින් වැඩිවන විට මුළු වියදම 10% කින් වැඩිවීම ඌනතාවය වර්ධනය වීමට හේතු වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

#### (අ) මූල්‍ය ප්‍රතිඵල

| | 2011 | 2010 | වැඩිවීම(අඩුවීම) ප්‍රතිශතය |
|---|---|---|---|
| | රු,000 | රු,000 | % |
| **ආදායම** | | | |
| නිමි තේ | 493,125 | 501,491 | (2) |
| වෙනත් | 276,674 | 231,225 | 20 |
| **මුළු** ආදායම | 769,799 | 732,716 | 5 |
| **වියදම** | | | |
| නිෂ්පාදන පිරිවැය | 703,258 | 648,678 | 8 |
| වෙනත් වියදම් | 118,954 | 98,213 | 21 |
| **මුළු** වියදම් | 822,212 | 746,891 | 10 |
| ශුද්ධ අලාභය | (52,413) | (14,175) | |
| ශුද්ධ අලාභ අනුපාතය | (6.81) | (1.93) | |

#### (ආ) මූල්‍ය තත්ත්වය

| | 2011 | 2010 | % |
|---|---|---|---|
| ජංගම නොවන වත්කම් | 703,494 | 553,051 | 27 |
| ජංගම වත්කම් | 264,465 | 306,431 | (13) |
| ජංගම වගකීම් | 966,218 | 867,805 | 11 |
| කාරක ප්‍රාග්ධනය | (701,753) | (561,374) | 25 |
| දිගුකාලීන වගකීම් | 344,993 | 318,088 | 8 |
| ප්‍රාග්ධන හා සංචිත | (342,252) | (326,411) | |
| ජංගම අනුපාතය | 1:4 | 1:3 | |
| ක්ෂණික වත්කම් අනුපාතය | 1:5 | 1:4 | |

**3.3** **ප්‍රාග්ධන බාදනය**

--------------

2010 වර්ෂයේදී ශුද්ධ වත්කම්වල සෘණ අගය රු.326,411,000 වූ අතර 2011 වර්ෂයේදී එම සෘණ අගය රු.342,252,000 ක් දක්වා වර්ධනය වී තිබුණි.

**3.4** **කාරක ප්‍රාග්ධන කළමනාකරණය**

--------------------------

2010 වර්ෂයේදී රු.561,374 ක්වූ ප්‍රාග්ධන ඌනතාව 2011 වර්ෂයේදී රු.700,753 ක් දක්වා වර්ධනය වී තිබුණි. මෙම අහිතකර තත්ත්වය මගහරවා ගැනීම සඳහා සුදුසු පියවර ගැනීමට කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි.

**4** **මෙහෙයුම් සමාලෝචනය**

--------------------

**4.1** **කාර්ය සාධනය**

-------------

(අ) 2010 වර්ෂය හා සසඳන විට 2011 වර්ෂයේදී මුළු තේ නිෂ්පාදනය කි.ග්‍රෑම් 47,950 කින් ඉහළ ගොස් තිබුණි. කෙසේ වුවද ආයතනයේ මුළු නිෂ්පාදනය දිගුකාලීනව පසුබෑමක් පෙන්නුම් කරයි.

(ආ) ආයතනයේ වතු 12 ක් සඳහා සාමාන්‍ය හෙක්ටයාරයක නිමි තේ අස්වැන්න කි.ග්‍රෑම් 688 වේ. මාතලේ මහනුවර ප්‍රදේශයට අදාලව හෙක්ටයාරයකට සම්මත නිමි තේ ප්‍රමාණය කි.ග්‍රෑම් 1,000 හෝ ඉහළ අගයන් ගතයුතු වුවත් ආයතනයේ එක් වතුයායක් පමණක් එම සම්මත ප්‍රමාණය ලබාගෙන තිබුණි.

(ඇ) තේ කිලෝ ග්‍රෑමයක දායකය අවාසිදායක මට්ටමක පැවතුණි. කිලෝග්‍රෑමයක නිෂ්පාදන පිරිවැය විකුණුම් ආදායම ඉක්මවා ගිය තත්තවයක් දිගින් දිගටම පෙන්නුම් කර තිබුණි.

**4.2** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ණය ගැනීමේදී ඇති කර ගන්නා ලද ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම මත අනාගතයේදී අනපේක්ෂිත ලෙස මුදල් ගලා යෑම් ඇතිවිය හැකිය.

(ආ) ණය ගැති හා ණය හිමි ලේඛන පවත්වාගෙන යාම දුර්වල මට්ටමක පැවතුණි.

(ඇ) අයවැය පිළියල කිරීම ඉලක්ක පිහිටුවීම මනා පරිචයකින් යුතුව ඉටුකර නොතිබුණි.

(ඈ) සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලේ දායක මුදල් ගෙවීම් වාර්තා නඩත්තු කිරීම ප්‍රමාණවත් නොවිය.

(ඉ) සේවක පාරිතෝෂිත, සේවක අර්ථසාධක හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් මත ඇති වන අධිභාරය සඳහා වෙන් කිරීම් කර නොතිබුණි.

(ඊ) පරිත්‍යාග වශයෙන් ලබාදීම සඳහා පිළියෙල කරන ලද රු.150,000 ක චෙක්පතෙහි කාබන් පිටපත හා අනෙකුත් ලේඛන වල එම මුදල අමාත්‍යාංශය වෙත යොමුකරන බව දක්වා තිබුණද, අමාත්‍යාංශය වෙත චෙක්පත් ලැබුණු බවට වාර්තා නොතිබුණි.

(ඔ) විධිමත් තක්සේරුවකින් තොරව හා දැවගස් හෙලිමට පූර්ව අවසර ගැනීම් ක්‍රියාපටිපාටි අනුගමනය නොකර ගස් 558 සඳහා රු.24,631,500 ක මුදලක් ලබාගෙන තිබුණි.

(ඖ) ආර්ථික වශයෙන් ඵලදායි ජීවකාලය ඉක්මවා ඇති වගාබිම් ප්‍රමාණය ආයතනයේ මුළු වගා කළ භූමියෙන් 73% ක් වී තිබුණි

(එ) ඉඩම් පරිපාලනය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බදු දෙන ලද වතු සමහරකට අදාල විස්තර ආයතනය **ස**තුව නොතිබුණි.

(ii) වැව්ලි සමාගම් වලින් අයකර ගත යුතු 2,071,000 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) බදුදී ඇති සහ ආයතනය විසින් පාලනය කරනු ලබන භූමි ප්‍රමාණයන් පිළිබඳව තහවුරු පරීක්ෂා ක්‍රියාමාර්ගයක් මගින් තහවුරු කර නොතිබුණි.

(iv) හෙකාටයාර් 11,915.08 ප්‍රමාණයක් ආයතනය භාරයෙන් බැහැරවී ඇති බව අනාවරණය වූ අතර, ඒවායෙහි වර්තමාන භාරකාරත්වය දරන්නන් හඳුනා ගැනීමට නොහැකි විය.

(v) ආයතනය විසින් බදු දී ඇති දේපළ කොටස් බදුකරුවන් විසින් විකුණූ අවස්ථා වාර්තාවී තිබුණු අතර, ආයතනය එම ක්‍රියාවන්ට විරුද්ධව ගෙන තිබුණු ක්‍රියාමාර්ග විගණනය වෙත ඉදිරිපත් නොවුනි.

(vi) බරන්සයිඩ් ෆරන්ඩේල් බංගලාව 1985 සිට 2011 දක්වා තක්සේරු වාර්තා නොමැතිව බදු දී තිබුණු අතර, 2011 තක්සේරු වාර්තාව ලබාගැනීමේදී බ**දු** දීමේ අරමුණ සඳහන් කර නොතිබුණි. විවෘත ටෙන්ඩර් කැඳවීමටද කටයුතු කර නොතිබුණි.

(vii) ශාන්ත හේලියර්ස් කර්මාන්තශාලාව රජයේ තක්සේරුවක් ලබා ගැනීමකින් තොරව 1988 දී රු.30,000 වාර්ෂික කුලියකට බදු දී තිබුණු අතර, වසර 10 අවසානයේදී දේප**ළ**ට හානිකර ඇති බව වාර්තා කර ඇත. 1998 දී බදු ගිවිසුම අවසන් වුවද නැවත තක්සේරු කර තිබුණේ 2003 වර්ෂයේදීය. එම තක්සේරු වාර්තාව අනුව වාර්ෂික කුලිය රු.81,000 වුවද එය නොසලකා ඊට අඩු මුදලකට බදු දීමට කටයුතු කර තිබුණි.

(viii) **වර්ෂ** 2002 දී හාතලේ වතුයායෙන් අක්කර 313 ක් ඉඩම් ප්‍රතිසංස්කරණ සභාවේ ඉල්ලීම පරිදි නිදහස් කිරීම මත ඉතිරි වූ අක්කර 408 ක් ආයතනය වෙත එකතු කර විධිමත් ලෙස කළමනාකරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ix) **ස**න්නිවේදන කු**ළුණු** සඳහා බදුදී ඇති ඉඩම් වලින් අයවිය යුතු බදු ප්‍රමාණයෙන් හා එම බදු ගිවිසුම් වල**ට** අදාල කොන්දේසි බදුකරු විසින් අනුගමනය කිරීම පිළිබඳ නියාමනයක් සිදුකර නොතිබුණි.

(x) වෛතලාව වතුයාය 2004 වර්ෂයේදී රු.1,325,293 ක වාර්ෂික බදු කුලියකට බාහිර පාර්ශවයකට බදුදී ඇති අතර, එම බදු මුදලින් 75% ක් වතුයායේ වගකීම් නිරවුල් කිරීමට යෙදවිය යුතු විය. එසේ නිරවුල් කළයුතු වගකීම් ප්‍රමාණය කොපමණද යන්න නිශ්චය කරගැනීමට ආයතනය සතුව තොරතුරු කිසිවක් නොතිබුණි.

(xi) විවෘත ටෙන්ඩර් කැඳවීමකින් තොරව හා රජයේ තක්සේරු වාර්තාවක් ලබාගැනීමකින් තොරව මාතලේ ඕපල්ගල වතුයායේ හෙක්ටයාර් 138 ක එනසාල් වගාව වාර්ෂික බදුකුලිය රු.350,000 බැගින් වර්ෂ 10**කට** බදු දී තිබුණි.

(ඒ) ආයතනයට අයත් මෝටර් රථයක් වෙනත් ආයතනයක භාවිතය සදහා දී තිබුණු අතර, සංස්ථාවට අයත් නොවන වාහනයක් සංස්ථාවේ රාජකාරි සදහා යොදා ගෙන තිබුණි. මෙම වාහන හුවමාරුවට අදාලව ආයතන දෙක අතර ලිඛිත වාර්තා නොතිබුණි.

(ඔ) චක්‍රලේඛ විධිවිධානයන්ට පටහැනිව හා විධිමත් අනුමැතියක් ලබා නොගෙන ආයතනයේ වාහන දෙකක් අළුත්වැඩියාව සදහා භාරදී තිබුණු අතර, එහි අළුත්වැඩියාව ඇස්තමේන්තුව රු.4,000,000 ඉක්මවා තිබුණි.

(ඕ) වර්ෂය ආරම්භයේදී රු.105,180,092 ක බැර ශේෂයක් අක්‍රීය ගිණුමේ පැවති අතර වර්ෂය තුල එකතුව රු.103,247,048 ක් වූ ගිණුම් ශේෂ හර කර ඇති බැවින් අවසන් ශේෂය රු.1,933,044 ක් බවට පත් වී තිබුණි. ගිණුම් වල ශේෂයන් හදුනාගෙන නිවැරදි කරනවා වෙනුවට එම ගිණුම් වල ශේෂයන් අක්‍රිය ගිණුම් ශේෂයන් ලෙස කපා හැරීමක් කර තිබුණි. මෙම ක්‍රියාවලිය සදහා නිසි අනුමැතීන් ලබාගැනීම කර නොතිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

රජයේ ඉඩම් බැහැර කිරීමේ ප්‍රතිපත්තියට පටහැනිව හා විධිමත් භාවයකින් තොරව ග්‍රෙගරි පාර ප්‍රධාන කාර්යාලය විකිණීමට කටයුතු කර තිබූ අතර, එම ගනුදෙනුවට අදාල ගිවිසුම් ප්‍රකාරව ආයතනය වෙත ලැබිය යුතු රු.මිලියන 243 න් රු.මිලියන. 11.9 කට අදාල මුදල් ලැබීම් පමණක් සනාථ වී තිබුණි.

## 4.4 නිශ්කාර්ය හා ඌන උපයෝජන වත්කම්

විගණන නියැදි පරීක්ෂාවට අනුව වතු 4 කට අදාලව කර්මාන්තශාලා 2ක්, වතු බංගලා 3 ක්, නිල නිවාස 35, තේ වියලන 01, මෝටර් වාහන 03 ක් වශයෙන් විශාල වත්කම් ප්‍රමාණයෙන් උපයෝජනයෙන් බැහැරව පවතින බව නිරීක්ෂණය විය.

## 4.5 ආර්ථික නොවූ ගනුදෙනු

සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේද් පහත හදුනාගෙන ඇති පරිදි ආර්ථික නොවන ගනුදෙනු ක්‍රියාත්මක කර තිබුණු.

| | රු. |
|---|---:|
| බ්‍රෝකර් අත්තිකාරම් පොලී | 16,587,161 |
| ආධාර | 390,464 |
| සේ.අ.අ.ගෙවීම් පැහැර හැරීම මත අධිභාර | 5,185,092 |
| ණය පොලී | 987,487 |
| නීතිඥ ගාස්තු | 2,863,941 |

## 4.6 හදුනාගන්නා ලද පාඩු

භාවිතයට නුසුදුසු තේ තොග අලෙවියට ඉදිරිපත් කිරීම මත වූ අලාභය රු.7,814,578 ක් වී තිබුණි.

# 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 සංයුක්ත සැලැස්ම

2009 – 2013 දක්වා වූ සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද එය ක්‍රියාත්මක කර නොතිබුණි.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

----------------

2011 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියල කර තිබුණද, එය සංයුක්ත සැලැස්ම හා වාර්ෂික අයවැයට සමගාමීව පිළියෙල කර නොතිබුණි. තවද, ක්‍රියාකාරී සැලැස්ම ඉටුකර ගැනීමේ ප්‍රගතිය කාලානුරූපව පරීක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් ආයතනය විසින් හඳුන්වා දී නොතිබුණි.

**5.3 විගණන හා කළමනාකරණ කමිටු**

---------------------------

2011 වර්ෂයේදී විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් 3 ක් පමණක් පවත්වා තිබුණි.

**5.4 අයවැය ලේඛනමය පාලනය**

----------------------

වියදම් විචලනය 15% - 12.5% දක්වා පරාසයක පැවති අතර, ආදායම් විචලනය 10% - 62% දක්වා පරාසයක විහිදුණි.

**5.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

--------------------------

2009 හා 2010 වර්ෂවලට අදාල වාර්ෂික වාර්තා සභාගත කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

-------------------\

(01) අත්තිකාරම් පියවීම අත්තිකාරම් ලේඛනය නඩත්තු කිරීමේ දූර්වලතා

(02) වාහන පාලනය වාහන ලිපිගොනු, දැනට වාහනය ඇති ස්ථානය හා භාවිතා කරන නිලධාරියා පිළිබඳ විස්තර නොමැති වීම.

(03) ඉඩම් හා දේපල බදුදීම සඳහා හඳුවා ගැනීම සිදුකොට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා නොගැනීම තක්සේරු ලබානොගැනීම මැනුම් කටයුතු නොකිරීම හා තරගකාරී මිල කැඳවීම් නොකිරීම වැනි දූර්වලතා නිරීක්ෂණය කෙරේ.

(04) ගිණුම් තැබීම, ආදායම් හා වියදම් ගිණුම් තැබීම වත්කම් වගකීම් ගිණුම් තැබීම විදිමත්ව සිදුකර නොතිබුණි.

(05) ජර්නල් සටහන් ආදායම්, වියදම් ශේෂයන් ගිණුම් අතර මාරු කිරීමේදී විධිමත්ව සිදුකර නොතිබුණි.

(06) අයවැය පාලනය නිෂ්පාදන, ආදායම් වියදම් ඇස්තමේන්තු කර ඇති දත්ත හා තත්‍ය අතර සැලකිය යුතු වෙනස්කම් තිබුණි.

එම්. මුණසිංහ
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

**SLSPC/FD**

නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක 306/72, පොල්දූව පාර
බත්තරමුල්ල

**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති කෙටුම් පත් වාර්තාව**

ඔබගේ එල්එස්/පී/එස්එල්පීසී/එෆ්/2011 හා 2012 සැප්තැම්බර් 13 දිනැති කෙටුම් පත් වාර්තාව සම්බන්ධවයි.

එමගින් අප වෙත යොමු කරන ලද විගණන විමසුම් සම්බන්ධයෙන් අදාල පිළිතුරු වාර්තාව ඔබගේ දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා මේ සමග යොමු කර ඇත.

.........................................
**ආචාර්ය විමල් විමලදාස**
සභාපති/ප්‍රධාන විධායක අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

පිටපත් : ලේකම්, රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය - දැනගැනීම පිණිස
ප්‍රධාන විධායක නිලධාරි - සී/ස රාජ්‍ය සම්පත් කළමණාකරන සංස්ථාව - දැනගැනීම පිණිස
වැඩබලන සාමාන්‍යාධිකාරි, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව - දැනගැනීම පිණිස
විගණන නිලධාරි, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව - දැනගැනීම පිණිස
ගණකාධිකාරි - ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව - දැනගැනීම පිණිස

2012.10.17

නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක 306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල

**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති කෙටුම් පත් වාර්තාව**

**2.3.1** ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම

(අ) විගණන **විමි**සුම හා එකඟ නොවේ. 2011 වර්ෂයේ ගිණුම් කරන ප්‍රමිති අංක 16 ට අනුව ප්‍රධාන කාර්යාලයේ සියළු දෙනාටම පාරිතෝෂිත වෙන්කිරීම් කර ඇත.

ඇමුණුමක් ඉදිරිපත් කර තිබේ.

(ආ) ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිති අංක 18

i. විගණන විමසුම හා එකඟ වේ. 2012 වර්ෂයේ ප්‍රාග්ධන සංචිත ගිණුමට ගැලපුම් කර ඉදිරිපත් කරනු ලැබේ.

ii. විගණන විමසුමහා එකඟ වේ. බදු දී ඇති මෙම ඉඩම හා ගොඩනැගිල්ල බදු ගිවිසුම අනුව බදු කුලිය වැඩි කර ගැනීමේ අරමුණෙන් ප්‍රත්‍යාගණනය කළ අතර, අදාල මුළු වත්කම් කණ්ඩායම ප්‍රමිති අංක 18 ට අනුව ප්‍රත්‍යාගණනය කල යුතු වුවත් විශාල මුදලක් වැය කිරීම ආයතනයේ පවතින මූල්‍ය අර්බුදකාරි තත්වය මත නොහැකි වී ඇත.

iii. විගණන විමසුම හා එකඟ වේ. 2012 වර්ෂයේ සිට ඒකාකාරි ගිණුම් කරණ ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නෙමු.

<u>**ගිණුම්කරන ප්‍රමිති අංක 24**</u>

2012 වර්ෂයේ ආයතනයේ ගිණුම් කරන ප්‍රතිපත්ති මගින් හෙලිදරව් කර ඉදිරිපත් කරනු ලැබේ.

**2.3.2** **ගිණුම් කරන අඩුපාඩු**

(අ) විගණන විමසුම හා එකඟ වේ. 2012 වර්ෂයේ නිවැරදි කරනු ලැබේ.

(ආ/ඇ) පාරිතෝෂිත අවිනිශ්චිත ගිණුමේ රු.162,847,658 න් රු.80,571,860 ක් 2011 වර්ෂයේ වතුවල පාරිතෝෂිත වෙන්කිරීම් වන අතර, මෙම ප්‍රමාණය 2012 වර්ෂයේ ලාභ/අලාභ ගිනුමට ගැලපීමෙන් නිවැරදි කර ඉදිරිපත් කරනු ලැබේ. ඉන් ඉතිරි රු.82,275,798 ක් 2006 ට පෙර සිට පැවත එන ශේෂයකි.

ශේෂ පිරික්සුමේ පාරිතෝෂිත වෙන් කිරීමේ ගිණුමේ ඇති රු.8,826,844.78 න් රු.4,352,999 ක් 2006 ට පෙර සිට පැවත එන ඉතිරිය රු.4,473,846 ක් කැලෑබොක්ක වතුයායේ 2011 පාරිතෝෂිත වෙන් කිරීම් වේ. එම ප්‍රමාණය 2012 වර්ෂයේදී ලාභ/අලාභ ගිණුමට ගැලපීමට කටයුතු කරනු ලැබේ. ඇමුණුම ඉදිරිපත් කර ඇත.

(ඇ) 2012 වර්ෂයේ ගිණුම් වලදී පාරිතෝෂිත වෙන් කිරීමේ ගිණුම නිවැරදි කර ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඉ) විගණන විමසුම හා එකග වේ. 2012 වර්ෂයේ ගිණුම් වලට ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඊ) විගණන විමසුම හා එකඟ වේ. 2012 වර්ෂයේ නිවැරදි කරනු ලැබේ.

(උ) විගණන විමසුම හා එකඟ වේ. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වරින් වර (එනම් 1995 දෙසැම්බර් මස ග්‍රෙගරි පාරේ සිට ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ ගොඩනැගිල්ල වෙතද, 2008 ජුලි මාසයේ කොටුව මුදලිගේ මාවතේ මහජන බැංකු ගොඩනැගිල්ලටද 2011 ජුලි මාසයේ ආදිපාද වීදියේ පොල් සංවර්ධන අධිකාරියේ ගොඩනැගිල්ල වෙතටද) ස්ථිර සේවා ස්ථානය වෙනස් කිරීම මත එහි පවතින ඉඩ පහසුකම් ප්‍රවාහනය යන කරුණු හේතු කොටගෙන බොහෝ ලිපිගොනු අතහැර පැමිණීමෙන් මෙම සමහර මූලික ලියකියවිලි අස්ථානගත වී ඇත. එබැවින් මෙහි සදහන් එක් එක් වත්කම් වල වෙන් වෙන්ව ඓතිහාසික වටිනාකම් හා ක්ෂය වෙන්කිරීම් ප්‍රමාණයන් සොයා ගැනීමට ලේඛණ සොයා ගැනීමට නොහැකි වී ඇත. එබැවින් විකුණන ලද වත්කම්වල අදාල පිරිවැයෙන් හා ක්ෂය වෙන් කිරීම් ගිණුම් වලින් ඉවත් කිරීමට නොහැකි වී තිබේ.

(ඌ) විගණන විමසුම හා එකඟ වේ. 2012 වර්ෂයේ නිවැරදිව ගිණුම් ඉදිරිපත් කරන්නෙම්.

(එ) විගණන විමසුම හා එකඟ වේ. 2012 වර්ෂයේ නිවැරදිව ගිණුම් ඉදිරිපත් කරන්නෙමු.

(ඒ) විගණන විමසුමට අනුව අප විසින් ප්‍රසිද්ධ කර ඇති අවසාන ගිණුමේ ඇති ලාභ අලාභ ගිණුම පිටු අංක 09 හි ඇති හා අපගේ ලෙජර් ගිණුම් වලට අනුව ඇති ලාභ අලාභ ගිණුම අතර වෙනසක් පවති. නමුත් අපගේ ලෙජර් ගිණුමට අනුව ඇති ලාභ අලාභ ගිණුමේ ශේෂය නිවැරදි වේ. නිවැරදි ලාභ අලාභ ගිණුම අපගේ ලෙජර් ගිණුම් අනුව පහත පරිදි වේ. ඇමුණුම ඉදිරිපත් කර ඇත.

| විස්තරය | ප්‍රදාන | ලාභ/අලාභ | එකතුව |
|---|---|---|---|
| ලෙජර් ගිණුම් අනුව ආරම්භක ශේෂය | 1,571,137,549 | 2,471,366,560.41) | (900,229,011) |
| ලෙජර් ගිණුම් අනුව නිවැරදි අලාභය | | (51,987,380.18) | (51,987,380.18) |
| ලෙජර් ගිණුම් අනුව ප්‍රත්‍යාගණන සංචිතය | | 147,613,494.96 | 147,613,494.96 |
| | **1,571,137,549** | **(2,375,740,445.63** | **(804,602,896.22)** |

(ඔ) හලාවත වැවිලි සමාගමට ගෙවිය යුතු රු.මිලියන 20 ක ණය මුදලට අදාල ගෙවිය යුතු පොලිය 2011 වර්ෂයේ ගිණුම් වලට ගෙන නැත. මෙය 2012 වර්ෂයේ නිවැරදි කර ඉදිරිපත් කරමු.

(ඕ) විගණන විමසුම හා එකඟ වේ. 2012 වර්ෂයේ ප්‍රදාන වටිනාකම හා ලාභ/අලාභ ගිණුමේ ශේෂය වෙන්ව පෙන්වීමට කටයුතු කරනු ලැබේ.

**2.3.3** **නොසැසුදු පාලන ගිණුම්**

(අ) විගණන විමසුම හා එකඟ වේ.

වතු ගිණුම් වෙනුවෙන් පිලියෙල කරන ලද ශේෂ පිරික්සුමේ මෙම අගයන්වල එකතුව බැර හා හර **ශේෂයන්** ලෙස විවිධ වගකීම් (Sundry Liabilities) රු.1,050,514,528 ක් ලෙසද, විවිධ වත්කම් ලෙස (Sundry Assets) රු.87,576,428 ක් පෙන්වා ඇත.

**විවිධ වගකීම්**

| | |
|---|---|
| වෘත්තිය සමිති | 1,619,348 |
| CPPS | 465,842 |
| ESPS | 2,419,079 |
| EPF | 363,180.815 |
| ETF | 17,282,411 |
| ණය හිමියෝ | 40,085,801 |
| සේවකයින් ගෙවිය යුතු (Workers Payable) | 55,566.640 |
| පාරිතෝෂිත වෙන්කිරීම් | 396,321,632 |
| පාරිතෝෂිත ගෙවිය යුතු | 166,384,256 |
| පැමිණීමේ ප්‍රසාද දීමනා ගෙවිය යුතු | 2,767,773 |
| රක්‍ෂණ - මුදල් ප්‍රවාහන | 728,674 |
| උපචිත | 1,186,729 |
| EPF – උසාවි ගෙවීම් | 2,505,528 |
| මුළුවිවිධ වගකීම් | 1,050,514,528 |

**විවිධ වත්කම්**

| | |
|---|---|
| වගාව | 35,312 |
| තැන්පතු | 142,500 |
| ප්‍රාග්ධන වියදම් | 277,278 |
| ණය ගැතියෝ | 2,125,412 |
| තොග | 10,287,338 |
| EPF තැන්පතු | 56,489,844 |
| අයකරගත යුතු | 16,490,600 |
| අග්‍රිම | 5,775 |
| අතැති මුදල් | 19,537 |
| බැංකු මුදල් | 202,832 |
| පාරිතෝෂිත තැන්පතු | 1,500,000 |
| මුළු විවිධ වත්කම් | **87,576,428** |

ඇමුණුම ඉදිරිපත් කර ඇත.

**(ආ)** විගණන විමසුම හා එකඟ නොවේ.

**විවිධ වත්කම් - රු.87,576,428**

ඉහත 2.2.3.(අ) සටහනේ දක්වා ඇති ශේෂයන් වල එකතුවම වේ. එම ශේෂයන් වෙන් වෙන් වශයෙන් ඒකාබද්ධ අවසන් ගිණුමේ දක්වා ඇත.

**අතුරු වගාවන් - කුරුඳ- රු.156,640**

ලෙජර් ගිණුම්වල නිවැරදිව දක්වා ඇති නමුත් ප්‍රසිද්ධ කරන අවසන් ගිණුම සැකසීමේදී අත් හැරී ඇත.

**Working (හර) රු.5,643,568**

වතුවල ලාභ/අලාභ ගිණුම වන මෙයට වතුවල ආරම්භක තේ තොගය හා අවසාන තේ තොගය ගැලපීමේදී එන ගිණුම් ශේෂය වේ. මෙය වතු ආදායම් වියදම් ගැලපීමට පෙර ශේෂය වන අතර වතුවල ආදායම් එකතුව හා වියදම් එකතුවද මෙම ගිණුමට ගලපා එන ලාභය හෝ අලාභය ජංගම හරහා ප්‍රදාන කාර්යාලයට මාරු කරනු ලැබේ. ඒ අනුව ඉහත ශේෂයට වතුවල ආදායම් හා වියදම් ගැලපූ පසු එන වතු සියල්ලගේම ලාභය හෝ අලාභය ජංගම ගිණුම හරහා ප්‍රධාන කාර්යාලයට මාරු කර ඇති නිසා අවසානයේදී ශේෂයක් ඉතිරි නොවේ. නමුත් මෙම ශේෂය අවසන් ගිණුම් වලට ඇතුලත් වී ඇත. ඒ අනුව මෙය නිවැරදි වේ.

ඇමුණුම ඉදිරිපත් කර ඇත.

**තැන්පත් - රු.142,500**

Capital Development Working Progress (Note 19) යටතේ අළුතින් විදුලිය ලබාගැනීම මගින් දක්වා ඇත. ඒ අනුව අවසන් ගිණුමේ දක්වා ඇත.

**වගාවන් - රු.35,312**

විලම්බිත වත්කම් සටහන් 18 යටතේ පාළු සිටුවීම මගින් දක්වා ඇත. ඒ අනුව අවසන් ගිණුමේ දක්වා ඇත.

**ප්‍රධාන කාර්යාලය ජංගම ගිනුම - රු.962,938,099**

මෙම ගිණුම වතු හා ප්‍රධාන කාර්යාලය අතර සිදුවන ගනුදෙනු (හර හා බැර) වශයෙන් සටහන් කිරීමට භාවිතා කරන ජංගම ගිණුම වේ. මෙම ගිණුමේ ශේෂය මගින් ප්‍රධාන කාර්යාලයට මාරු කර ඇති **සියළුම** හර හා බැර ගිණුම් ශේෂ වල ඇති වෙනස නියෝජනය වේ. එම නිසා ඒකාබද්ධ අවසන් ගිණුමේදී මෙය ප්‍රධාන කාර්යාල ජංගම ගිනුම යන නමින් තනි ගිනුමක් ලෙස පෙන්නුම් නොකරයි.

**(ඇ)** විගණන විමසුම හා එකග නොවේ.

**ආවරන වගාව (Shade & Organic) පළිබෝධ මර්ධනය (Pest Control)**

වියදම් වර්ග දෙකක් ලෙස මාසික ගිණුම් වල පෙන්වා ඇතත් සමහර මාසවල එම වියදම් දෙකම මාසික ගිණුම් වල (Todate Expenditure) එකට එකතු කර ඇත. ඒ නිසා වතු මාසික ගිණුම් වල දක්වා ඇති වටිනාකමත් (මාස 12 හිම එකතුව) අවසන් ගිණුම අනුව ඇති වටිනාකම නිවැරදි වේ.

ඇමුණුම ඉදිරිපත් කර ඇත.

**<u>ප්‍රවාහනය</u>**

වතු ගිණුම් අනුව දක්වා ඇති වටිනාකමෙන් තේ ප්‍රවාහනයේදී තේ තොගයේ ඇතිවූ අඩුවීම තේ ප්‍රවාහනය කරන ප්‍රවාහන කරුට ගෙවිය යුතු බිලෙන් අඩුකර දැක්වීමේදී මෙම වෙනස ඇති වී ඇති අතරම වතු ගිණුම අනුව තිබෙන වියදම නිවැරදි බැවින් 2012 ලාභ අලාභ ගිණුමට ගැලපීමට කටයුතු කරනු ලැබේ.

**<u>ක්‍රීඩා හා සුභසාධනය</u>**

වතු ගිණුම් වල පෙන්වා ඇති ක්‍රිඩා හා සුභසාධන අයිතමය හා කාර්යාල සේවකයින්ට හා කම්කරුවන්ගේ සුභසාධනය සඳහා ලබාදෙන තේ සඳහා යන වියදම් දෙක එකට එකතු කිරීමෙන් අවසන් ගිණුම් වල ක්‍රිඩා හා සුභසාධන අයිතමය යටතේ එක් වියදමක් ලෙස පෙන්වා ඇත. එමෙන්ම මෙම කාර්යාල සේවකයින්ට හා කම්කරුවන්ට දෙන තේ වියදම භාගල වත්ත එහි ජංගම ගිණුම හරහා ප්‍රධාන කාර්යාලයට මාරු කර ඇති අතර එම වියදම එම වතුවලට අදාල බැවින් එයද ප්‍රධාන කාර්යාලයේදි අදාල වතු ගිණුම් වල ඉහත අයිතමයට එකතු කර ඇත. කෙසේ නමුත් අවසන් ගිණුම් අනුව දක්වා ඇති වියදම නිවැරදි වේ.

**<u>දළු නෙලීම/කොන්ත්‍රාත් දළු නෙලීම</u>**

වතුයායේ මාසික ගිණුම් වාර්තාවේ දෙවැනි පිටුවේ සඳහන් වියදම් වාර්තාවේ **දළු** නෙලීම අංක 50 සහ අම**තර දළු** නෙලිම අංක 63 යන වියදම් දෙක එකට එකතු කර **දළු** නෙලීම යන වියදම් යටතේ දක්වා ඇත. එනමුත් වතු ගිණුම් අනුව වියදමක් අවසන් ගිණුම් අනුව වියදමත් අතර වෙනසක් නොමැති අතර අවසන් ගිණුම් නිවැරදිව දක්වා ඇත.

**<u>නිවාඩු දින ගෙවීම්/පැමිණීමේ ප්‍රසාද දීමනා</u>**

වතු ගිණුම් අනුව හා අවසන් ගිණුම් අනුව එම ශේෂයන් සමාන වේ. නමුත් විගණන වාර්තාවේ දක්වා ඇති ශේෂයන් වතු ගිණුම් අනුව සොයා ගත නොහැක.

**<u>PSS – Price Share Settlement</u>**

ඕපල්ගල වතුයායේ ගිණුම් වල පොදු කාර්ය වියදම් (General Expenses) යටතේ PSS-Price Share Supplement යන වියදම් පෙන්වන අතර නිෂ්පාදන වියදම් යටතේද PSS – Price Share Supplement වියද**මේ**ංකොටසක් පෙන්වා ඇති බැවින් අවසන් ගිණුම් සෑදිමේදී එම වියදම් දෙකම එකතු කර අවසන් ගිණුම් වල පෙන්වා ඇති බැවින් මෙම වෙනස පෙන්වයි. නමුත් අවසන් ගිණුම් අනුව ඇති PSS-Price Share Supplement වියදම නිවැරදි වේ.

**<u>මායිම් හා කානු (Boundaries & Ravines)</u>**

වතු ගිණුම් අනුව පවතින ශේෂය අවසන් ගිණුම අනුව ඇති ශේෂයන් සමාන වේ. විගණන වා**ර්**තාවේ පවතින ශේෂයන් සොයා ගත නොහැක.

**<u>වතු අධිකාරි වාහන</u>**

වතු ගිණුම් අනුව පවතින ශේෂය හා අපගේ අවසන් ගිණුම් අනුව පවතින ශේෂය අතර වෙනසක් නොපවතින අතර, විගණන වාර්තාවේ සඳහන් වන ශේෂය සොයා ගත නොහැක. අවසන් ගිණුම් අනුව ශේෂය නිවැරදි වේ.

**<u>මුරකරු</u>**

කැලෑබොක්ක වතුයායේ මාසික වියදම් වාර්තාවේ 2 වැනි පිටුවේ මුරකරු වියදම් තිරුව හා අමතර මුරකරු වියදම් තිරුව යන දෙකම එකට එකතු කර මුරකරු වියදම් වශයෙන් තනි වියදමක් පෙන්වා ඇත. ඒ අනුව වතු අවසන් ගිණුමේ වියදම හා අවසන් ගිනුම් වල වියදම් අතර වෙනසක් නැත. එබැවින් අවසන් ගිණුමේ වියදම නිවැරදි වේ.

**<u>රක්‍ෂණය</u>**

රක්‍ෂණ වියදම් ගිණුම වර්ෂ අවසානයේදී වතු ජංගම ගිනුම හරහා ප්‍රධාන කාර්යාලයට මාරු කර ඇත. ඒ අනුව කොටගඟ වතුයායේ පමණක් එම මාරුකිරීම සිදුකර නොමැති නිසා කොටගඟ අදාල වටිනාම පමණක් අවසන් ගිණුම් වල පෙන්වා ඇති බැවින් මෙම වෙනස ඇති නමුත් අවසන් ගිණුම් අනුව ඇති ශේෂය නිවැරදි වේ.

**<u>ආදායම් - රිකිලි තේ විකුණුම්</u>**

අවසන් ගිණුම අනුව රිකිලි තේ විකුණුම් ආදායම් ගෙන අත්තේ වතු මාසික ගිණුම් වාර්තාවල ඇති ජංගම ගිණුම හරහා ප්‍රධාන කාර්යාලයට මාරු කර ඇති රිකිලි තේ විකිණීමෙන් ලද ලාභය හෝ අලාභයපමණී. (මෙහි ලාභය හෝ අලාභය ගණනය කරන්නේ අදාල වතු වලිනි) ඒ අනුව අවසන් ගිණුම් අනුව ඇති රිකිලි තේ විකිණීමෙන් ලද ආදායම නිවැරිදි වන අතර විගණන වාර්තාවේ සඳහන් රු.140,566 ක මුදල සොයා ගත නොහැක.

**<u>අබලි ද්‍රව්‍ය විකිණීම</u>**

අබිලි ද්‍රව්‍ය විකිණීමෙන් ලද මුදල් ප්‍රධාන කාර්යාලයට ලැබී අදාල වතුවලට දැනුම්දී ඇත. ඒ අනුව වතු ලෙජර් ගිණුම් අනුව මෙම අබලි ද්‍රව්‍ය විකිණීමෙන් ලද මුදල් ශේෂය නිවැරදි වේ.

ඇමුනුම ඉදිරිපත් කර ඇත.

(ඇ) විගණන විමසුම හා එකඟ නොවේ.

**<u>වලහන්දුව වත්ත</u>**

**<u>වැටුප් හා දීමනා / සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල / හිඟ චෙක්රෝල් වැටුප් වතු අධිකාරි වාහන / වෛද්‍යාධාර / රක්‍ෂණය</u>**

වලහන්දුව වත්තේ සේවය කරන වසන්ත කීර්ති මහතාගේ සම්පූර්ණ වැටුප හා ඊට අදාල ව්‍යවස්ථාපිත ගෙවීම් සිදුකරනු ලබන්නේ ප්‍රධාන කාර්යාලයෙන් බැවින් ඔහුගේ වැටුප හා අනෙකුත් ව්‍යවස්ථාපිත දීමනා වියදම් සම්පූර්ණ ප්‍රමාණයම ප්‍රධාන කාර්යාලයේදී වලහන්දුව වත්තේ ගිණුම් සැදීමේදී වලහන්දුව වත්තේ වියදම් වලට එකතු කරන බැවින් හා වලහන්දුව වතු අධිකාරි ඉංගිරිය වතුයායේ වැඩ බැලීම නිසා ඔහුගේ වැටුප/දීමනා හා අනෙකුත් වියදම් වලින් භාගයක් ඉංගිරිය වත්තේ වැඩ බැලීම වෙනුවෙන් ඉහත වියදම් වලින් අඩුකර ප්‍රධාන කාර්යාලය මගින් ඉංගිරිය වත්තට මාරු කර ඇති බැවින් ඉහත දක්වා ඇති වතු ගිණුම්වල ශේෂයන් හා අවසන් ගිණුමේ ඇති ශේෂයන් සමග සමාන නොවුනත් අවසන් ගිණුම් අනුව ඇති ශේෂයන් නිවැරදි වේ.

**රක්ෂණය**

වලහනදුව වත්තේ වතු ජංගම ගිණුම හරහා ප්‍රධාන කාර්යාලයට මාරු කර ඇති රක්ෂණය සඳහා වන වියදම් වෙන් කිරීම වලහන්දුව වත්තේ දෙසැම්බර් මස අවසාන ගිණුමේ දෙවන පිටුවේ සඳහන් රක්ෂණ වියදමට වඩා වැඩි අගයක් ගන්නා බැවින් රක්ෂණ වියදම සෘණ අගයක් ගෙන ඇත. අනෙක් වතුයායන්හි රක්ෂණ වියදම අවසාන ගිණුම් සැකසීමේදී ගැලපුම් කරන්නේද මේ අයුරින්ම වුවත් එහිදී රක්ෂණ වියදම හා රක්ෂණ වියදම් වෙන් කිරීම යන අයිතමයන් දෙකම සමාන වන බැවින් රක්ෂණ වියදම ශුන්‍යය අගයක් ගනී. ඒ අනුව අවසන් ගිණුමේ දක්වා ඇති ප්‍රමාණයන් නිවැරදි වේ.

වලහන්දුව වතුයායේ ආදායම් ගිණුම් හා වියදම් ගිණුම් ලාභ අලාභ ගිණුමට මාරු කිරීමට පෙර ප්‍රාදේශීය කාර්යාලයේ ගිණුමේ ශේෂය රු.15,466,632 ක් වන අතර ආදායම් වියදම් ගිණුම් ලාභ අලාභ ගිණුමට මාරු කල පසු ප්‍රාදේශීය කාර්යාලය ගිණුමේ ශේෂය (රු.1,093,422.87) වේ. මෙම බැර ශේෂයට වලහන්දුව වත්තේ ලාභයද (රු.16,560,054.59) එකතු කර අවසන් ගිණුම් වල රු.17,653,477 ලෙස ප්‍රාදේශීය කාර්යාල ගිණුම පෙන්වා ඇත. එසේ වුවද අවසන් ප්‍රතිඵලයට මෙයින් බලපෑමක් සිදුව නැත.

**(ඉ)** විගණන විමසුම හා එකඟ වේ. මෙය සාදික්කා අතුරු බෝග අලාභයකි. මෙය ඒකාබද්ධ අවසන් ගිණුම සැකසීමේදී කල වැරුද්දකි. නමුත් ලෙජර් ගිණුමට අනුව නිවැරදිව ගිණුම් ගත කර තිබේ.

(ඊ) විගණන විමසුම හා එකඟ නොවේ.

විගණන වාර්තාවේ අවසන් ශේෂය ලෙස දක්වා ඇත්තේ 2010 වර්ෂයේ ආදායම් වියදම් ගිණුම් ලාභ /අලාභ ගිණුමට මාරු කිරීමට පෙර ශේෂයන්ය. එම 2010 වර්ෂයේ වතුවල ආදායම් වියදම් ගිනුම් වල ශේෂයන් ලාභ/අලාභ ගිනුමට මාරු කල පසු 2010 වර්ෂයේ ශේෂ පිරික්සුමේ එන ශේෂයන් 2011 වර්ෂයේ ආරම්භක ශේෂ හා සමාන වේ.

ඇමුණුම ඉදිරිපත් කර ඇත.

(උ) විගණන විමසුම හා එකඟ නොවේ.

අවසන් ගිණුම් සඳහා වතු අංශයේ ඉදිරිපත් කරන ලද ස්ථාවර වත්කම් පිරිවැය උපලේඛණයේ සඳහන් පිරිවැය වතු ලෙජර් ගිණුම් අනුව නිවැරදි වේ. ක්ෂය ගණනය කිරීම සඳහා සකසා ඇති උපලේඛණයේ අන්තර්ගත වන්නේ දැනටමත් ක්ෂය වෙමින් පවත්නා වත්කම් වල පිරිවැය පමණි. එහි ආරම්භක ශේෂය සටහන් කර නොමැති නිසා මෙම වෙනස පෙන්නුම් කලත් ලෙජර් ගිණුම් අනුව ඇති ශේෂය නිවැරදි වේ.

(ඔ) අක්‍රිය ගිණුම් පිළිබඳ තොරතුරු ඉදිරියේදී මෙම අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරන්නෙමු.

### 2.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ)(ආ)(ඇ) විගණන විමසුම හා එකඟ වේ. ඉදිරියේදී මෙම අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරන්නෙමු.

**2.3.5** **විගණනය සඳහා සාක්ෂි නොවීම**

**ස්ථාවර වත්කම්/ක්ෂය වෙන්කිරීම් - ප්‍රධාන කාර්යාලය**

අප ආයතනය **වරින්** වර සේවා ස්ථානය මාරු කිරීමේදී අත්‍යාවශ්‍ය බොහෝමයක් ලිය කියවිලි, පොත් පත්, වාර්තා රැගෙනවිත් නොමැති බැවින් මෙම ස්ථාවර වත්කම් වලට අදාලව විධිමත්ව පවත්වාගෙන ආ ලේඛ**න** සොයාගත නොහැක.

**<u>තැන්පතු - රු.126,253,215 (T/B)</u>**

ස්ථාවර තැන්පතු - රු.57,482,590

මේ සඳහා ප්‍රධාන කාර්යාලයේ ගිණුම් අංශයේ ලිපි ගොනුවක් ඇත. මෙය විගණන අංශය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරමු.

තැන්පතු - රු.68,770,625 (Note -22)

තැන්පතු ලෙස ඉහත වටිනාකමින් පෙන්වා ඇත්තේ අපගේ වතුවල සේවක අර්ථසාධක/සේවා නියුක්තිකයන්ගේ අරමුදල, පාරිතෝෂිත නඩු සඳහා වාරික වශයෙන් ගෙවීම් කල මුදලයි. මෙම මුදල් අදාල නඩුව සඳහා ගෙවීම් කර ඉවර වන තුරු තාවකාලිකව මෙලෙ**ස** තැන්පතු ගිණුමක පෙන්වා ඇත. අදාල නඩුව සඳහා සම්පර්ණයෙන්ම ගෙවීම් කල පසු ගෙවිය යුතු සේවක **අ**ර්ථසාධක අරමුදල/සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල ගෙවිය යුතු පාරිතෝෂිත ගිණුමට හර කර ඉහත තැන්පතු ගිණුමට බැර කරනු ලැබේ. වතු කාර්යාල වල අදාල තහවුරු ලිපිලේඛණ ඇත.

**<u>ණයගැතියෝ/ණයහිමියෝ හා අයකර ගත යුතු ශේෂ</u>**

විගණන විමසුම හා එකග වේ. ඉදිරියේදී හැකි පමණ නිවැරදි කර ඉදිරිපත් කිරීමට කටයුතු කරමු. එමෙන්ම සමහරක් ණයගැතියන් හා ණයහිමියන් සඳහා සනාථ කිරීමේ ලිපි ලේඛණ ඇත. සේවා ස්ථානයේ පිහිටීම වරින් වර වෙනස් වීම හේතු කොට ගෙන බොහෝ ලිපි ලේඛණ අස්ථාන ගත වී ඇත.

**2.3.6** **<u>නීතිරීති රෙගුලාසිවලට අනුකූල නොවීම</u>**

(අ) **<u>පනත්</u>**

(i) 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(i) වගන්තිය
ඉහත පනතට අනුව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

(ii) 1983 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත
(iii) 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීම් පනත

ආයතනය දිගින් දිගටම මුහුණ පා ඇති දැඩි මූල්‍ය අර්**බුද**කාරි තත්වය හේතු කොටගෙන ඉහත පනත් (ii)(iii) වලට අනුකූලව ගෙවීම් කටයුතු කිරීමට නොහැකි වී ඇත.

(ආ) **ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි**

(i) මු.රෙ. 135,135(5)

විගණන විමසුම හා එකඟ වේ. අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ii) මු.රෙ.371(2)(අ)(ඇ)

මාණ්ඩලික නිලධාරින් ආයතනයේ නොමැති නිසා සභාපතිතුමා, සාමාන්‍යාධිකාරිගේ අනුමැතිය මත මාණ්ඩලික නොවන නිලධාරින්ට අත්තිකාරම් මුදල් ලබාදීමට කටයුතු කර ඇත. මාණ්ඩලික නිලධාරින් බඳවා ගත් පසු ඉහත රෙගුලාසි අනුව කටයුතු කරනු ලැබේ.

(iv) මු.රෙ.372 (ආ)(ඇ)

විගණන විමසුම හා එකඟ වේ. අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(v) මු.රෙ. 386

විගණන විමසුම හා එකඟ වේ. අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(vi) මු.රෙ. 1645

විගණන විමසුම හා එකඟ වේ. අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(vii) මු.රෙ. 1646

විගණන විමසුම හා එකඟ වේ. අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ආ) **ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය**

(i) සහ (ii)

**viii පරිච්ඡේදයේ 10.1(අ) වගන්තිය/viii පරිච්ඡේදයේ 10.3 වගන්තියහ ා 1997 මැයි 23 දිනැති අංක 118 (අ) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය**

උක්ත කරුණ සඳහා ඔබගේ අංක EL/G/SLSPC/2011/A 01/09 2011.12.12 වන දින තොරතුරු කැඳවීම සම්බන්ධයෙන් අප විසින් ලබාදෙන පිලිතුරට අමතරව පහත පැහැදිලි කිරීම්ද ඉදිරිපත් කරමු.

ආයතන සංග්‍රහයේ viii පරිච්ඡේදයේ 10.1 (අ) (ආ) අනුව ගෙවිය හැකි උපරිම දින සංඛ්‍යාව මසකට දින 08 කි. 10.3 වගන්තියට අනුව දෙපාර්තමේන්තු (ආයතන ප්‍රධානියාගේ) අනුමැතිය ලබා ඇත.

ඇමුණුමක් ඉදිරිපත් කර ඇත.

ආයතන සංග්‍රහයේ එසේ සඳහන් වුවත් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව හා ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙනුවෙන් 1996 මාර්තු 05 වන දින එවකට සිටි සාමාන්‍යාධිකාරී එල්.මඩවල මහතා විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර මෙමෝ පතට අනුව 1996 වර්ෂයේ සිට මේ දක්වාම දීමනාවක් විධායක ශ්‍රේණියේ නිලධාරින්ට සෙනසුරාදා / ඉරිදා හා නිවාඩු

දිනයන්හි සේවයේ නිරත වීම වෙනුවෙන් මෙම දීමනාව ලබාදී තිබේ. මෙය ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ මෙන්ම ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ අභ්‍යන්තර චක්‍රලේඛයක් මත පදනම්ව කල ගෙවීමකි. 1996 සිට වර්ෂ ගණනාවක් ගත වුවත් මේ පිළිබඳව මීට පෙර විගණන විමසුමක් අප ආයතනයට ලැබී නැත.

ඇමුණුම ඉදිරිපති කර ඇත. (අභ්‍යන්තර චක්‍රලේඛයද අමුණා ඇත).

(ඈ) **චක්‍රලේඛ**

(i) 2003 පෙබරවාරි 02 දිනැති අංක 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛනය
චක්‍රලේඛයේ එසේ සඳහන් වුවත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිව ඇතිව ගෙවීම් සිදුකර තිබේ.
ඇමුණුම ඉදිරිපත් කර ඇත.

(ii) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

විගණන විමසුම හා එකඟ වේ. ඒ අනුව අඩුපාඩු අවම කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

**2.3.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

(අ) විගණන වාර්තාවේ දක්වා ඇති රු.12,215,142 ප්‍රමාණය පරිපාලන වියදම් නොව පොදුකාර්ය පිරිවැය ලෙස නිවැරදි විය යුතු අතර එම පොදුකාර්ය පිරිවැයෙන් අඩුකර ඇති ප්‍රමාණය නැවත වගා කටයුතු සඳහා දැරූ ප්‍රාග්ධන වියදම් හා දැනටමත් කරගෙන යන ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් පොදුකාර්ය පිරිවැයෙන් වෙන් කර ගත් ප්‍රමාණයයි. මෙය නැවත වගා කිරීම් යටතේ පෙන්වා ඇත.
ඇමුණුම ඉදිරිපත් කර ඇත.

(ආ) ග්‍රෙගරි පාර ඉඩම විකිණීම
විගණන විමසුම හා එකඟ වේ.

අඩුපාඩු පෙන්නුම් කරනු ලැබුවත් වර්තමානයේ මෙම ගනුදෙනුවෙන් පසු ග්‍රෙගරි පාර ඉඩම පිළිබඳව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට හිමිකමක් නොමැත.

**3 මූල්‍ය සමාලෝචන**

**3.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>**
විගණන විමසුම හා එකඟ වේ.

**3.2 විග්‍රහත්මක මූල්‍ය සමාලෝචනය**

(අ) මූල්‍ය ප්‍රතිඵල

විගණන විමසුම හා එකඟ වේ.

(ආ) මූල්‍ය තත්වය

**3.3 ප්‍රාග්ධන බාදනය**

විගණන විමසුම හා එකඟ වේ.

**3.4 කාරක ප්‍රාග්ධන කළමණාකරනය**

විගණන විමසුම හා එකඟ වේ. ඉදිරියේදී මෙම තත්වය මගහරවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

(අ) විගණන විමසුම හා එකඟ වේ. තේ නිෂ්පාදනය දිගු කාලීනව අඩුවන අපනතියක් පෙන්නුම් කිරීමට පහත හේතූන් ප්‍රදාන වශයෙන් බලපා ඇත.

- බීජ තේ ගස්වලින් ලැබෙන තේ දළු ප්‍රමාණය රිකිලි තේ ගස්වලින් ලැබෙන තේ දළු ප්‍රමාණයට වඩා අඩු වීම, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතුව වැඩි බිම් ප්‍රමාණයක් ඇත්තේ මෙම බීජ ගස් සහිත තේ ඉඩමීය.

- අවුරුදු 50 කටත් වඩා පැරණි තේ වගාවක් අප සතු වීම.

- කාරක ප්‍රාග්ධනයේ ඌණතාවයක් නිසා නියමිත පරිදි අවශ්‍ය පොහොර, රසායනික ද්‍රව්‍ය ලබාදීමට නොහැකි වීම.

- තේ හෙක්ටයාරයකට තිබිය යුතු නිශ්චිත තේ ගස් ප්‍රමාණය නොතිබීම.

(ආ) විගණන විමසුම හා එකඟ වේ. මේ සඳහා හේතු වන්නේ ඉහත 4.1(අ) ලබා දුන් තත්වයන්ම වේ.

(ඇ) විගණන විමසුම හා එකඟ වේ. මෙයට පහත හේතූන් බලපා ඇත. තේ කිලෝග්‍රෑමයක විකුණුම් මිල පහල යාම හා තේ කිලෝග්‍රෑමයක නිෂ්පාදන වියදම ඉහල යාමට පහත හේතූන් නිරන්තරයෙන්ම බලපා ඇත.

විකුණන මිල පහල යාමට හේතු

- ලෝක වෙළඳපලේ තේ ඉල්ලුම සඳහා පවතින තත්වයන්
- අප කර්මාන්තශාලා වල පවතින අඩුපාඩුකම් මගහරවා ගැනීමට ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් නොමැතිකම නිසා හොඳ තත්වයේ තේ නිෂ්පාදනයක් සිදු නොවීම
- අයහපත් මූල්‍ය තත්වය නිසා තේ තැරැව්කරුවන්ගේ අත්තිකාරම් ලබාගැනීම හේතු කොටගෙන තේ වෙන්දේසියේදී ඔවුන්ගේ බලපෑම් වලට යටත් වීමට සිදුවීම නිසා තේ විකුණුම් මිල අඩුවීම.
- තේ කිලෝග්‍රෑමයක නිෂ්පාදන වියදම වැඩිවීම සඳහා බලපාන ලද හේතු

වර්ෂ 4 කට සැරයක් සාමුහික ගිවිසුම් මගින් හා දේශපාලනික බලපෑම් මත කම්කරුවන්ගේ වැටුප් වැඩි අගයන් වලින් වැඩිවීම නිෂ්පාදන වියදම වැඩිවීම කෙරෙහි බලපාන පාලනය කල නොහැකි සෘජු සාධකයකි.

**4.2** <u>කළමණාකරන අකාර්යක්ෂමතා</u>

(අ)(ආ)(ඇ)(ඈ)

ඉහත අංක වලට අදාල විගණන විමසුම් හා එකඟ වේ. ඉදිරියේදී මෙම දුර්වලතාවයන් මගහරවා ගැනීමට කටයුතු කරමු.

(ඉ) ආයතනයේ ගිණුම් කරණ ප්‍රතිපත්තියක් ලෙස සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල, සේවක පාරිතොෂිත හා සේවක අර්ථසාධක අරමුදල් නොගෙවීම මත ඇති වන අධිභාරය සඳහා වෙන් කිරීමක් සිදුනොකරන අතර, අදාල වර්ෂයන්හි අධිභාරය සමග හගවීම් කල පසු එම අධිභාරය අදාල වර්ෂයේ වියදමක් ලෙස ලාභ/අලාභ ගිණුමට ගලපනු ලැබේ.

(ඊ) මෙය පරීක්ෂා කර බලා අවශ්‍ය ලේඛණ ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

(උ) විගණන විමසුම හා එකඟ වේ. ඉදිරියේදී අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(එ) විගණන විමසුම හා එකඟ වේ.

(ඒ) <u>**ඉඩම් පරිපාලනය**</u>

(i)(ii)(iii)(v)(vi)(vii)(viii)

ඉහත අංක වලට අදාල විගණන විමසුම් හා එකඟ වේ.

පැවති අඩුපාඩු නිවැරදි කර ගැනීමට හා අඩුපාඩු අවම කර ගැනීමටත් කටයුතු කරනු ලැබේ.

විස්තර සඳහන් ඇමුණුමක් ඉදිරිපත් කර ඇත.

(iv) විගණන විමසුම අසම්පූර්ණ බැවින් තොරතුරු සැපයීම අපහසු වේ.

(x) **වෛතලාව වත්ත**

මේ පිළිබඳව තවදුරටත් පරීක්ෂා කල යුතුව ඇති බව අභ්‍යන්තර විගණන අංශය මගින් දන්වා ඇති බැවින් ඉදිරියේදී තොරතුරු ඉදිරිපත් කරමු.

(xi) විගණන විමසුම හා එකඟ වේ. මේ සම්බන්ධව ජනාධිපති විමර්ෂනයක් සිදුකර ගෙන යනු ලැබේ.

**(ඔ)** විගණන විමසුම හා එකඟ වේ. අංක WP 5690 දරණ කාර් රථය ඇල්කඩුව වැවිලි සමාගමේ සභාපතිවරයා පාවිච්චිය සඳහා යොදාගත් අතර ඇල්කඩුව වැවිලි සමාගමේ සිට මෙම සංස්ථාවේ සභාපතිවරයා ලෙස පත්ව ආ සභාපති තුමා විසින් වතු සංචාරක කටයුතු සඳහා කාර් රථයට වඩා ජීප් රථය සුදුසු යැයි තීරණය කරමින් අංක 32-0600 දරණ ජීප් රථය භාවිතා කරන ලදී. වාහන හුවමාරුව සම්බන්ධ අදාල වන ලිපි ලේඛණ සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරමු.

(ඕ) විගණන විමසුම හා එකඟ වේ. මෙම සංස්ථාව සතු අංක 32-3758 දරණ ජීප් රථය අළුත්වැඩියා කටයුතු සඳහා යොමු කිරීමේ සිට ඉන් ඔබ්බට සිදුවී ඇති සියළුම ක්‍රියාවන් නීති විරෝධී අක්‍රමිකතාවනට යටත්ව සිදුව ඇතැයි යන විශ්වාසය මත අධිකරණයේ නඩුවක් විභාග

වෙමින් පවතින අතරම, අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව මගින් පරීක්ෂණයක් සිදුකරගෙන යනු ලබයි.

(ය) විගණන විමසුම හා එකඟ වේ. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි.

**4.3 නිෂ්කාර්ය හා ඌණ උපයෝජිත වත්කම්**

විගණන විමසුම හා එකඟ වේ. ඉදිරියේදී මෙම වත්කම් උපයෝජනය කිරීම සම්බන්ධ කටයුතු කරනු ලැබේ.

**4.4 ආර්ථික නොවන ගනුදෙනු**

විගණන විමසුම හා එකඟ වේ.

**බ්‍රෝකර් අත්තිකාරම් පොලි/සේ.අ.අරමුදල් ගෙවීම පැහැර හැරීම මත අධිභාර/ණය පොලී**

ආයතනයේ අඛණ්ඩව පවතින දැඩි මූල්‍ය අර්බුදය හමුවේ. එදිනෙදා අත්‍යවශ්‍ය ගනුදෙනු පවත්වාගෙන යාම සදහා තේ තැරැව්කරුවන්ගෙන් අත්තිකාරම් මුදල් ලබා ගැනීම හා බැංකු හා වෙනත් ආයතන වලින් ණය මුදල් ලබා ගැනීමට සිදුවීම නිසා ඒ සදහා පොලි මුදලක් ගෙවීමට සිදුවීම. ඉහත සදහන් දැඩි මූල්‍ය අර්බුදය නිසාම සේ.අ.අරමුදල් නියමිත පරිදි ගෙවීමට නොහැකි වීම නිසා ඒ මත පැන නගින නඩු සදහා අධිභාරද ගෙවා ඇත.

**ආධාර**

සාමාජීය හා දේශපාලනික අවශ්‍යතා මත මෙවැනි ගෙවීම් කිරීමට සිදුව තිබේ.

**නීතිඥ ගාස්තු**

ඉදිරියේදී වියදම අඩුකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

**4.5 හඳුනාගන්නා ලද පාඩු**

මේ පිළිබඳව අවසාන නිගමනයකට පැමිණ නැති බැවින් පිළිතුරක් ලබාදීමට නොහැක.

**5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**5.1 සංයුක්ත සැලැස්ම**

සංයුක්ත සැලැස්මේ පැවති **සියළුම** දේ ක්‍රියාත්මක කිරීම සදහා යහපත් මූල්‍ය තත්වයක් ආයතනය සතු නොවීමත් ක්‍රියාත්මක කිරීමේ විවිධ ගැටළුකාරි තත්වය මීට හේතු වී ඇත.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

විගණන විමසුම හා එකඟ වේ. ඉදිරියේදී අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමු.

**5.3 විගණන හා කළමණාකරන කමිටු**

විගණන විමසුම හා එකඟ වේ.

**5.4 අයවැය ලේඛණය පාලනය**

විගණන විමසුම හා එකඟ වේ. මේ තත්වය ඉදිරියේදී අවම කර ගැනීමට කටයුතු කරමු.

**5.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

විගණන විමසුම හා එකඟ වේ. ඉදිරියේදී ප්‍රමාද වීම් වලක්වා ගැනීමට කටයුතු කරමු.

**6.** **පද්ධති හා පාලනයන්**

**(1) (2) (3) (4) (5) (6)**

ඉහත අංක යටතේ සඳහන් විගණන විමසුම් හා එකඟ වේ.

ඉදිරියේදී මෙහි සඳහන් දුර්වලතා මග හරවා ගැනීමට කටයුතු කරමු.

..................................................................

**ආචාර්ය විමල් විමලදාස**
**සභාපති / ප්‍රධාන විධායක නිලධාරි**
**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව**